# GAṄGAROHANAYA

with a gloss

BY

WELIGAMA DHAMMAJJOTI UNNANSE.

# ගඞ්ගාරෝහණවර්ණනාව

සහ

සන්නය

නානායක්කාර කරුණාරත්න

වෙල්ලාලගේ සීමන් ප්‍රේරා

විසින්

අච්චුගස්වනලදී.

පොතක මිල රුපියල් එකයි.

කොළඹ

ලඞ්කාභිනව විශ්‍රැත යන්ත්‍රශාලාවෙහි

අච්චුගසනලදී.

1876.

# පූර්වාරම්භය

විවිධ කවිජන නිවාසී භූත මාතර නම් පූරප්‍රවරයෙහි මීට අවුරුදු හැට නමයකට පමණ පූර්වකාලයෙහි අහුරුගම් සහ සතර බත්ගම් ඇතුළුව ගහබඩපත්තුව කෙරෙව් දුර්ත්දසරම් විජයසේකර ජයතිලක රනනාමුදලි මන්ත්‍රීශ්වරයන් විසින් නිල්වලා ගඞ්ගාවෙහිදී කරවනලද උදුරනාර පුණ්‍ය කර්මයක් වර්ණනාකිරීම් සඳහා සමරසේකර දිසානායක මුහන්දිරම් මැතිඳු විසින් විරචිත ගඞ්ගාරෝහණ වර්ණනාව ලඞ්කාවාසීන් අතරේ ඉතාප්‍රශස්තය—විචිත්‍රානි මධුර පද්‍යයෙන් අලඞ්කෘතය—අතිමනෝහරවාක්‍යපඞ්ක්තීන්ගෙන්යුක්තය-එහිතිබෙණ සම්භර ශ්ලොක බොහෝදෙනා විසින්තේරුම් ගත නොහැකි ඉතා ගම්භීර අර්ථඇත්තේමය-එබැවින් එලුව ඉගෙණගන්නා අයට එහි අනර්ඝතාවය දැනගන්ට නොහැකිවා පමණක් නොව ඇතිසැටි අර්ථ රසයවිඳගැන්මද පහසු නැතිහෙයින් තල්පේපත්තුවේ මලලගම රිතිරිගල්දේවාල හොඩැල්ලේ විහාරස්ථානේ නිවාසීවැලිගම ධම්මජෝතිඋන්නාන්සේයන මම ඒ මධුර කාව්‍ය බඞ්ධනයෙන් සාලඞ්කෘතවූ ගඞ්ගාරෝහණ වර්ණනාව මගේ දැනුම් පමනින් ශුද්ධකොටඅලුත එලුව ඉගෙණ ගන්නා අයගේ ප්‍රයෝජනය සඳහා අර්ථයන් වඩුදුනු විධියට පදගත සන්නයක්කොළෙමි-මේකාව්‍ය රචනාකළ මුහන්දිරම්මැතිඳුගෙ පරපුර දැක්වීමසඳහා යෝග්‍යවූ කරුණු නොයෙක් ලෙසයෙව් තුමුන් විස්තර වසයෙන් යම්කි දැනගන්ට ලැබුනේනැත ඔහු හිරුවාපත්තුවේ තාරිපේරිය යනගම ගොය්වංශයේ වැදගත් පවුලකකෙනෙක්බව ගඞ්ගාරෝහණ වර්ණනාව අවසානයෙහි "දගෙය්කුලේ සමරසේකරනම් දිසානායනාදී ශ්ලොකයෙන් පෙනේ-ඔහුකිනම් ආචාර්යයෙක්කෙනෙක් ගුරුකොට ඉගෙණගත්තාදැයි අපවිසින් කිසි සොනකින්නොදන්නාලදි-සාලිඇලේ ස්ථවිරයන්වහන්සේගේ ගෝලයෙකැයි ශ්‍රැතපරම්පරාවෙන්ප්‍රකාශයි-උන්වහන්සේ මාතර අසල රම්‍යවූ විහාරස්ථානයක වැඩසිටි මධුර මනෝහර කාව්‍ය බන්ධනයෙහි අතිදක්‍ෂවූ මුද්දසඞුන්හි පැවිදිලත් මහතෙරුන් වහන්සේකෙනෙක්ය-මෙහිසඳහන්කළ මුහන්දිරම් මැතිඳු උගත් අලුතදිම සම්පන්නයෙක් බව කොළඹ ආදී නොයෙක් රටවල ප්‍රසිද්ධ බැවින්දෙන් අබ්‍රහම්ද සරම් දෙවෙනි මහමුදියන්සෙ රාලහාමිද-ජෝහන්එව්ස්පිරිස් මුදියන්සෙරාලහාමිද වෙනත් කොළඹවැසිතිපදෙනෙක් එතෙම ගුරුකොටගෙණ කරුණු පිලිවිස දැනගැන්මෙන් ආශ්‍රයකරණලද්දෙය-කොළඹ සිටි කාලයෙහි ආණ්ඩුවෙන් මුහන් දිරම් තනතුරක් ලබාගණමාතරට පැමිණ දෙන්දුවීන් ජයතිලක අබයසිරිවර්ධන ලඞ්කා

[redacted] ඹිවාසල මහමුදියන්සෙ රාලහාමිවෙන හැවනි සිටිය බව [redacted] මෙම මැතිඳුගේ නෑදෑයින් දැනට වැඩි දෙනෙක් නැති නමුත් ඔහු දක්ෂ කථා බස්කළ අටවල් නවම මාතර වසත්-දවිත්ද සරම් මුදලිඳුතුමාපුරාණ ප්‍රසිද්ධ වහතුන්ගෙන් පැවතආ දශපුණ්‍ය ක්‍රියාවෙහි යෙදී නොයෙක් කුසලසම්භාරයන් රැස්කළාවූ සද්ධාවන්ත වැදගත් කෙනෙක්ය-උන්වහන්සේගේ නෑදෑ මහත්තැන් මේ පලාතේ සහා කොළඹ ආදී නොයෙක් ප්‍රදේශවල නවම මහත් නිලධාරිව වසත්- නමින් කාදිසා මැතිතුමන්ගේ වංශයෙන් පැවතා අන්තෝනන්ද සරම් ඩරසිංහ සිරිවඩිනා මුදියන්සේරාලහාමි මෙම ලක්දිව කොලොම්පුරය අසල ගල්කිස්සේ නැවැති සල්පිටිකෝරලේ කරවුයේය—උන්වහන්සේගේ පුත්‍රවූ දුමිංගුද සරම් විජයසේකර අබය රතන ගාදිදිගේ මුහන්දිරම් මහත්මයාගේ හතරවෙනි පුත්‍රයා දවිත්දසරම් මුදලිඳුය-උන්වහසේගේ මැතියන් වහන්සේ දෙන්සිමන් තිලක රතන අබය වඩීන මුදියන්සෙරාලහාමිගෙ නැඳනිවූ දෝන කතිරිනා තිලක රතන ලමාඑතනිය—දවිත්ද සරම් මුදලිඳු දෙන් අබ්‍රහම් ඉලඞගක්කෝන් මුදලින්දුයන් වහන්සේගෙ නැඳනිවූ දෝනා පෙලාරුන්තිනා මැතිනිය සමග කාරබැඳ දූවනිවරු තුන්දෙනෙක් ඇතුව සිටියේය-වැඩිමහල් අනනෙනතනාද සරම් මැතිනිය දෙන්දවිත් ජයතිලක ඉලඞගක්කෝන් වාසල මහ මුදියන්සෙ රාලහාමි සමගද දෙවෙනිවූ ජොහානා කැලාරාද සරම් මැතිනිය දෙන් ජුවන් ඉලඞගක්කොන් මුදියන්සෙරාලහාමිසමගද- තුන්වෙනිවූ ජෙතර්නැලා පෙලාරුන්තිනාද සරම් මැතිනිය දෙන් සිමන් නවරත්න තෙන්නකොන් මුදියන්සෙ රාලහාමි සමගද කාරබැඳ සිටි බව විවාහ ලේකම් පොත්වලින් දැනගන්ට ලැබුනි. ගඞ්ගාරෝහණ කාව්‍යයෙහි සිව්වෙනි ශ්ලෝකයේ-සසර, සරණ, සව්, සත්දම්, යනගණතුනේ පෙරමැද අග වර්ණවලින් සරම් යන් කවි ස්මීන්ගේ නාමය පැදෙන්නේ නැතැයි මිහිරිපැන්නේ සාමි දරුවන් විසින් දීපු කල්පනාවක් ගැන මීට ඉහත වැදගත් වාදයක් ඉපදී පාශ්වීදෙකක්වී යනලබ්ධනරණ ශාස්ත්‍රාලඞ්කාරයන ප්‍රසිද්ධ පත්‍රදෙකකින් එක කලක් වාදකරණ ලද්දේ නුමුත් එහි නිරණයක් අපි නොදනිමු—ඉන්පසු එලුව ගැන බොහෝ වැදගත් කාරුණ්‍ය රාශියක් රටට ප්‍රකාශ වුනා පමණක් නොව ඉගණගන්නා අයට ශාස්ත්‍ර භාවිතෝද් ග්‍රන්ථ රාශ කිරී මෙහි මහත් ආලෝකයක්ද ගටගත්තේය.

තවද-ගුත්තිල්වලා ගහදුන් මයවිද් සෙල්වි යනාදි ශ්ලෝකයෙහි සහ යෙහෙකැය් මේ මැතිඳුන් බිලා ගත සරින් දන්නේ සිරින් දිත්ගුරා යනාදි ශ්ලෝකයෙහි අර්ථකිමටත් බෝහෝ අවාසිවරයෝ කැකතාරත්-එසේ නුමුත් අපට දැනෙනා හැටියට ශුතුවූ අර්ථකියා ඇති-මෙම පොත දවිවුගැස්වීමට ශ්‍රීපාදස්ථානයෙහි නායකස්ථානානතරයට පැමිණි තකිවතකරණ කාවකලඞ්කාරාදී අනෙක ශාස්ත්‍රාන්තරයෙහි පූර්ණ පාර විබුධ ජන

ගෙබ්රවූ සිප් කබුවේ සුවිභාලාභී ධාන නායක ප. පීදරුවන් වහන්සේ ගෙන්ද බොහෝ ආධාරලැබුනාට අපි සතුති කරමු—මේ ගන්ධාරෝහණ අත්ථවණ්ණනාය ප්‍රසිද්ධ කිරීමට කාව්‍යාලඞ්කාරාදී නෛක ශාස්ත්‍රවාණියෙන් භාවිතෝද්ග්‍රහණය කිරීම සඳහා ප්‍රියවිනීතාත්විතවූ දැනට තල්පේ පත්තුව කරවන ජයතිලක ගුණරත්න මුදලිඳුන් වහන්සේ සර්වප්‍රකාරයෙන් ප්‍රතිෂ්ඨාධාරවූයේය-මෙම මන්ත්‍රීශ්වරයානන්ගේ උදව් නැත් නම් මෙය ප්‍රසිද්ධ කරන්ට අතිසයින්ම නොහැකිය-මෙහිවණ්ණිනා කාර්තිබෙණ උදාරතර පුණ්‍යකර්ම්‍යට කතෘවූ යරම් මුදලිඳුන් වහන්සේට මුනුබුරුවූ ජෝන්පාලින්නැයින් දවිත් අබෙ සිරිවර්ධන ඉලංගකෝන් වැලිගම්කෝරලේ කරවන කොළඹවාසල මුදලි මන්ත්‍රීශ්වරයන් වහන්සේට අපවිසින් මෙම අත්ථ වණ්ණනාය ඔප්පුකරණලදී—මෙහි ප්‍රමාදාදියෙන් පැමිණිදෝෂ ඇත්නම්ද-පණ්ඩිතයෝ ඒ දූෂශෝධනාදියෙන් ලෝකාර්ථ කෙරෙත්වා.

මෙම පොත් නැවත අච්චු ගැස්වීමේ අයිති කම මෙහි අත්ථවණ්ණනාය කළවූ වැලිගම ධම්මජෝති උන්නාන්සේ යන මටම තබාගත් බව දත යුතුයි.

වැලිගම ධම්මජෝති.

බුද්ධවර්ෂ 2419 ක්වූ ඉල්වස 15 වෙනි දින රිහිරි ගල් දේවාල ගොඩැල්ලේ විහාරස්ථානේදීය.

# ශුද්ධ පත්‍රය.

| පිටේ, | පෙළේ. | වරද. | හරි. |
|---|---|---|---|
| 1 | 7 | ධොවන | ධෝවන |
| 1 | 10 | කනතාව | කානතාව |
| 1 | 17 | සියෙකින් | සියේකින් |
| 1 | 24 | සියෙකින් | සියේකින් |
| 2 | 9 | නාගරෝත්තමයෙක් | පුරප්‍රවරයෙක් |
| 2 | 33 | සාසකෘන | සංස්කෘත |
| 3 | 20 | සන්තොෂ | සන්තෝෂ |
| 6 | 24 | ශත්‍රාද්වයය | ශත්‍රාද්වයාය |
| 7 | 18 | සර | සරා |
| 7 | 22 | පනතිවලින්ද | පඞ්ක්තිවලින්ද |
| 7 | 23 | කරනනවූ | කරන්නාවූ |
| 8 | 23 | ලොකයා | ලෝකයා |
| 8 | 24 | නවුකාවක් | නෞකාවක් |
| 10 | 20 | කනතාවද | කානතාවද |
| 13 | 21 | ඡගභාවෙති | ඊගඩිගාවෙති |
| 14 | 16 | එකල | එකල්හි |
| 15 | 16 | සිග්‍රුවසිග්‍රුව | සිඝ්‍රුවසිඝ්‍රුව |
| 19 | 2 | ප්‍රවාලහාරය | ප්‍රවාලහරය |
| 21 | 16 | දුමෙන්යවී | දුමෙන්ගැවු |
| 22 | 24 | අලඞ්නවූ | අලඞ්කෘතවූ |
| 23 | 21 | සබෙමේ | සගිමේ |
| 24 | 1 | යබකත් | යබකත් |
| 31 | 1 | මුක්තාහාරය | මුක්තාහරය |
| 33 | 17 | අග්‍රශ්‍රවකයන | අග්‍රශ්‍රාවකයන් |
| 34 | 10 | සබගප් | සබනැප් |
| 35 | 13 | සභාවෙ | සභාවෙති |
| 35 | 32 | සෙවන්ගෙ | සේවතුන්ගෙ |
| 36 | 8 | ගියේදකිය | ගියේදැයිකියා |
| 37 | 31 | දීශානායක | දිසානායක |

# ගඞ්ගාරෝහණ වර්ණනාව.

1 සිළුමිණිරැසඹින් දෙව් දෙව් බඹුන්නා නරන්ගෙ
හළ පලහ සුරගේ දප්මුලින් සක් සිරින් යුත්
සැදි සුදුනිය රැස් මීකත් අළුත් පුල්සරින් ගත්
වඳිමි සිරිපතුල් අත්දී මුදුන් දම් රදුන්ගේ

1 දෙව්, දෙවියන්ගේද; බඹුන්, බ්‍රහ්මයන්ගේද; නා, නාගයන්ගේද; නරන්ගේ, මනුෂ්‍යයන්ගේද; සිළුමිණිරැස, සිඛාමාණික්‍යරශ්මිනමැති; අඹින්, ජලයෙන්; දෙව්, ධොවනයකළාවූ; පලහඅසුරගේ, පලහනම්අසුරේන්ද්‍රයාගේ; දප්, දර්පය; මුලින්, මුලෝච්ඡනාව; හළ, හැරියාවූ; සක්සිරින් යුත්, චක්‍රලක්ෂණයෙන්යුක්තාවූ; සුදු, ශ්වෙතවර්ණවූ; නියරැස්, නඛරශ්මියෙන්; සැදි, සර්ජිතවූ; මීකත්, මහීකාන්තාවවිසින්; පුල්, පිපුනාවූ; අළුත්, අභිනවවූ; සරින්, පද්මයෙන්; ගත්, ග්‍රහණයකළාවූ; දම්රදුන්ගේ, ධර්මරාජයාගේ; හෙවත්, බුදුන්ගේ; සිරිපතුල්, ශ්‍රීපාදමය, අත්මුදුන්දී; හස්තමස්තකප්‍රාප්තකොට, වඳිමි, නමස්කාරකෙරෙමි.

2 සද ලකර සදත් දත් කවි දනන්සිත් ඇළුම් වස්
සැදහැදසු සිරිත්දම් සත් සතන්ගේ වැඩුම් වස්
ගඟරුවන නමින් සිත් කල් ඇරුත් නෙක් විරිත්යුත්
කරමි පද බැඳීමක් ලක් බසින් ගත් සියෙකින්

2 සදලකර, ශබ්දාලඞ්කාරයන්හා; සදත්දත්, ශබ්දාර්ථයන් දත්තාවූ; කව්දනන්, කාව්‍යජනයන්ගේ; සිත්ඇළුම්වස්, චිත්තාලයවම්පිණිසද; සත්සතන්ගේ, සත්පුරුෂජනයන්ගේ; සැදහැද, සද්ධාවද; සුසිරිත් දම්, සුචරිතධර්මයද; වැඩුම්වස්, වර්ධනයසඳහාද; ගඟරුවනනා, ගඞ්ගාරෝහනවර්ණනායයි; මින්, මේනාමයෙන්; සිත්කල්, චිත්තකාන්තවූ; අරුත්, අර්ථයෙන්හා; නෙක්විරිත්යුත්, අනෙකවෘත්තයෙන් යුක්තාවූ; ගත් සියෙකින්, ග්‍රන්ථශතයකින්; හෙවත්, ශ්ලෝක සියයකින්; ලක්බසින්, සිංහලවිපභාෂාවෙන්; පදබැඳීමක්, පද්‍යබන්ධනයක්; කරමි, කරනෙමි.

3 සපිරිවර මැතින් මන් බුන් රිපුන් යෝබලන් සෙව්
යස සිරි සැපතින් යුත් සේ දනන්ගේ නිවෙස්යුත්
වෙළඳ විදු දනන් සල් පිල් අවන් හල් පෙළින්යුත්
පවර පුරවරෙක්වී මාතොටැයි දෙව් පුරෙක්වන්

3 රිපුන්, ශත්‍රූන්ගේ, මත්, මාන්‍යයන්; බුන්, භග්නකළාවූ; යෝබලන්, යෝධභටයන්හා; සපිරවර, පරිවාරසහිතවූ; මැතින්, මන්ත්‍රීන්විසින්; සෙවි, සෙවිනාලද්දාවූ; යස, යසපත්වූ; සිරිසැපතින්යුත්, ශ්‍රීසම්පත්තියෙන් යුක්තාවූ; සේදනන්ගේ, ධවලජනයන්ගේ; නොහොත්, ශ්වේතජනයන්ගේ; නිවෙස්යුත්, නිවාසයෙන් යුක්තාවූ; වෙළඳ, වෙළඳජනයන්ගෙන්ද; විදුදනන්, විද්‍යාවන්තජනයන්ගෙන්ද; සල්පිල්, කඩපිලින්හා; අවන් හල්පෙලින්යුත්, ආපනසාලාපංක්තියෙන්යුක්තාවූ; දෙව්පුරෙක්වන්, දිව්‍යපුරයක්සමානවූ; පවර, උතුම්වූ; මාතොටැය්, මහාතීර්ථයයි කියනලද; පුරවරෙක්, නගරෝත්තමයෙක්; වී, වූයේය.

4 සසර සරණසවිසත් දම් අමාවෙන් සතොස්වා
සගපවග සැපත්දුන් දම් රදුන් දම් සඟුන්සෙවි
පෙරමැදග වණීන් මේ තුන්ගෙණේ මුල් කොමෙන්නම්
පතලමැති සඳෙක්වී මේ පුරේකිත් දෙදෙක්වන්

4 සසර, සංසාරයෙහි; සරණ, සඤ්චාරණයකරන්නාවූ; සවිසත්, සකලසත්වයන්; දම්අමාවෙන්, ධර්මාමෘතයෙන්; සතොස්වා, සන්තෝෂකරවා; සගපවගසැපත්, ස්වර්ගාපවර්ගසම්පත්තීය; දුන්, දානයකළාවූ; දම්රදුන්, ධර්මරාජන්වූසර්වඥයාද; දම්, ධර්මයද; සඟුන්, සඞ්ඝයාද; සෙවි, සේවනයකළාවූ; මුල්මේතුන්ගෙණේ, මුල් මේ ත්‍රිවිධගණයෙහි හෙවත් මුල්වූ තුන්ගණයෙහි; කොමෙන්, පිළිවෙළින්; පෙරමැද ගවණීන්, ප්‍රථම මධ්‍යාන්තවර්ණියන් කරණකොටගෙණ; නම්, නාමයෙන්; පතල, ප්‍රසිද්ධවූ; කිත්, කීර්තියෙන්; දෙදෙක්වන්, ධවජයක්බඳුවූ; මැතිසඳෙක්, මන්ත්‍රීරත්නයෙක්; මේපුරේ, මේ මහා තිත්ථාභිධාන නගරයෙහි; වී, වූයෙයි.

5 රකිණ මුනිවදන් සිත්හි තබා සිත් මිණක්මෙන්
නිතර බුදුකුරෙව් දන් සිල්පවත්නා සැදෑයුත්
වෙද ගණිත සැදැස්දොජු සත් පෙදෙස් බස් සිරිත්ලෙව්
මගද සකු වෙසෙස් දත් නන් සැපත්යුත් පිනින් ලත්

5 මුනිවදන්, සර්වඥවචනයන්; සිත්හිතබා, චිත්තයෙහි ස්ථාපනයකොට; සිත්මිණක්මෙන්, චින්තාමාණික්‍යයක්පරිද්දෙන්; රකිණ, රක්ෂාකරන්නාවූ; බුදුකුරෙව්, බුද්ධාඞ්කුරයෙක්මෙන්; දන්, දානයෙහිද; සිල්, ශීලයෙහිද; නිතර, නිරන්තරයෙන්; පවත්නා, ප්‍රවෘත්තිනවන්නාවූ; සැදෑයුත්, සද්ධාවෙන්යුක්තවූ; වෙද, වෛද්‍යයද; ගණිත, ගණිතයද; සදැස්, ඡන්දසද; දොජුසත්, ජ්‍යොතිශාස්ත්‍රයද; පෙදෙස්බස්, ප්‍රදේශිකභාෂාවන්ද; ලෙව්සිරිත්, ලෝකචාරිත්‍රයන්ද; මගද, මූලභාෂාවද; සකු, සංස්කෘතභාෂාවද; වෙසෙස්දත්, විශෙෂයෙන්දත්තාවූ; පිනින්ලත්, පුණ්‍යකර්මයෙන්ලද්දාවූ; නන්සැපත්යුත්, නොයෙක්සම්පත්තියෙන්යුක්තාවූ.

6 වදනාභරණ මුවෙන් වෙන්සාල් උරෙන් දම් සෑදෑ වෙන්
නිරිඳු සිත නැණින් සව් සත් සතන් සිත් බසින්ගත්
දිලිඳු ලොබ දනින් වික්මෙන් රිපුන්ගේ විපක් සිත්
හළ මෙමැති වෙසේ සිත් පින්කිරුමේ පවත්වා

6 වදනාභරණ, වාක්වනිතාව; හෙවත් සරස්වතිය; මුවෙන්, මුඛයෙන්; වෙන්සාල්, විෂ්ණුකාන්තාව හෙවත් ශ්‍රීකාන්තාව; උරෙන්, වක්ෂස්ථලයෙන්; දම්, ධර්මය; සෑදුවෙන්, සර්වාවෙන්; නිරිඳුසිත, නරේන්ද්‍රචිත්තය; නැණින්, ඥානයෙන්; සව්සතන්, සකලසත්වයන්ගේ; සිත්, චිත්තය; සත්බසින්, සත්පුරුෂවචනයෙන්; ගත්, ග්‍රහණයකළාවූ; දිලිඳු, දරිද්‍රයන්ගේ; ලොබ, ලෝභය; දනින්, දානයෙන්; රිපුන්ගේ, ශත්‍රූන්ගේ; විපක්සිත්, විපක්ෂචිත්තය, වික්මෙන්, වික්‍රමයෙන්; හළ, පහකළාවූ; මෙමැති, මේමන්ත්‍රීතෙමේ; සිත්, චිත්තය; පින්කිරුමේ, කුසල්කිරීමෙහි; පවත්වා, පැවැත්වීමෙන්; වෙසේ, වාසයකෙරේ.

7 කොඳ තරිඳු රැසින්මෙන් ලෙව්සතන් සිත් සතොස්නා
හරණ රිපු විපක්තිමිරැස් තෙදින් මෙන් තමස්රැස්
මනවඩන කිවිඳුන්ගේ දෙව් අමාවෙන් සුරන්මෙන්
මෙමැතිසඳ කුසල්දම් හි පවත්නා සැදෑ සුත්

7 කොඳ, කෞමුදයන්; රැසින්, අමාරැසින්ප්‍රබෝධකරන්නාවූ; තරිඳුමෙන්, තාරකේන්ද්‍රයාපරිද්දෙන්; ලෙව්සතන්, ලෝකසත්වයන්ගේ; සිත්, චිත්තයන්සන්තොෂකරන්නාවූ; තමස්රැස්, අන්ධකාරරාශිය; තෙදින්, තේජසින්හරින්නාවූ; තිමිරැස්මෙන්, සූර්‍ය්‍යාපරිද්දෙන්; රිපු, සතුරන්ගේ; විපක්, විපක්ෂභාවය; හරණ, දුරුකරන්නාවූ; දෙව්අමාවෙන්, දිව්‍යඅමෘතයෙන්; සතුටුවන්නාවූ; සුරන්මෙන්, දෙවියන්පරිද්දෙන්; කිවින්ගේ, කවීන්ගේ; මනවඩන, මනෝවර්ධනයකරන්නාවූ; කුසල්දම්හි, කුසලධර්මයෙහි; පවත්නා, ප්‍රවෘත්තිතවන්නාවූ; සැදෑසුත්, සර්වාවෙන්යුක්තවූ; මෙමැතිසඳ, මේමන්ත්‍රීචන්ද්‍රතෙමේ.

8
දාගැප් බෝමළු දාගෙවල් පිළිමරූ සැදුගෙවල් දන්ගෙවල්
පන්සැල් පෝයගෙවල් බුදුන්වඩිනාතැන් සිල්වත්දනන්ඉන්නාතැන්
දම්හල් මල්පුදනාගෙවල් සහ නොයෙක් දේවාලකෝවිල්නැතක්
විල් සෙල් මල් පලාරම් උයන්වැලි තලාගම් නම් පසන් ගල්තලා

8, දාගැප්, ධාතුගර්භද; බෝමළු, බෝධිමාලකද; දාගෙවල්, ධාතුගෘහයන්ද; පිළිමරූසැදු, ප්‍රතිමාරූපසර්ජනකළාවූ; ගෙවල්, ගෘහද; දන්ගෙවල්, දානගෘහයන්ද; පන්සැල්, පර්ණසාලාද; පෝයගෙවල්, උපෝසථාගාරයන්ද; බුදුන්වඩිනතැන්, බුද්ධවන්දනාස්ථානයන්ද; සිල්වත්දනන්, සීලවන්ත

ජනයන්; ඉන්නතැන්, ඉඳිනාස්ථානද; දම්හල්, ධර්මසාලාද; මල්පුදනා, පුෂ්පපූජාකරන්නාවූ, නොයෙක්ගෙවල්සහ, නොයෙක්ගෘහයන්සහිතව; නැතක්දේවාලකෝවිල්, නොයෙක්දේවාලකෝවිල්ද; මල්, ආරණ්‍යද; පලරම්; ඵලාරාමද, සෙල් ශෛලද; මල්රම්, පුෂ්පාරාමද; උයන්, උද්‍යානද;!වැලිතලා, වාලුකාස්ථලද; ගම්, ග්‍රාමද; නම්පසන්, නාමයෙන්ප්‍රශංශනීයවූ; ගල්තලා, පාෂාණතලයෂ.

9

කෙත්වත් ඕවිටි ඌරුබිම් තැනිතලා මේ ඈ තැනන්හි නොයෙක්
නන්පින් කම් කරවා බලා නුවනැසින් ඉන්නා කලෙක් හි යලිත්
මේ පින්වත්හට වී සිතක් ගහදියෙක් හී පින්කමක් නන්සිරින්
ලෙව්සත් සිත්පිණවා කාලොත් යහපතැය් ඉන් මේතුමානන්විසින්

9 කෙත්, ක්ෂේත්‍රද; වත්, වතුද; ඕවිටි, ඕවිටිද; ඌරුබිම්, ඵනුකරබිම්ද; තැනිතලා, තැනිතලාභූමිද යන; මේඈ, මේආදිවූ; නොයෙක්තැනන්හි, නොයෙක්ස්ථානයන්හි; නන්, නොයෙක්; පින්කම්, පුණ්‍යකර්මයන්; නුවනැසින්, ඥානාක්ෂියෙන්; බලා, නිරීක්ෂණයකොට; කරවා, කරවමින්; ඉන්නාකලෙක්හී, වාසයකරණකාලයෙක්හී; යලිත්, නැවතත්; මේපින්වත්හට, මේපුණ්‍යවන්තයාට; ගහදියෙක්හී, ගඩිගාථලයෙක්හී; නන්සිරින්, නොයෙක්ක්‍රියාවෙන්; පින්කමක්, පුණ්‍යකර්මයක්; ලෙව්සත්, ලෝකසත්වයාගේ; සිත්පිණවා, චිත්තප්‍රීණනයකරවා; කලොත්, කලහොත්; යහපතැය්, යහපත්යයි; සිතක්වී, සිතක්ඇතිවූයේය; ඉන්, එසේහෙයින්; මේතුමානන්විසින්, මේඋත්තමයානන්විසින්.

10 පවර සකවසින් එක්වාදහස් සත්සියක් යුත්
විසිඅටිනුදු වප්මස්හි නැකත් වප් මොහොත්ලත්
පසඩ මසට වක් පෝදා පටන් සව්සතන්සිත්
සතුටුකර නිතින් බත් පැන් දෙමින් ඒසිතුසේ

10 පවර, ප්‍රවරවූ; සකවසින්, සකරාජ වර්ෂයෙන්; එක්වාදහස් සත්සියක් විසිඅටින්, එක්දහස්සත්සියවිසිඅටින්; යුත්, යුක්තවූ; උඳුවප්මස්හි, උඳුවප්මාසයෙහි; නැකත්වක්මොහොත්ලත්, නක්ෂත්‍රවක්මුහුර්තලද්දාවූ; පසඩමසට, පශ්චිමාර්ධමාසයෙහි; අටවක්පෝදාපටන්, අටවක පෝයදිනපටන්; නිතින්, නිරන්තරයෙන්; බත්පැන්දෙමින්, භක්තපානීයදානයකරමින්; ඒ සිතුසේ, ඒ චින්තනයකළපරිද්දෙන්; සව්සතන්සිත්, සකලසත්වයන්ගේචිත්තය; සතුටුකර, සන්තුෂ්ටකොට.

11 සුදනාදනා යොවුන් පත් කල්බඳුන් පොල් පුවක් තල්
වතුකුඹුරු ගෙවල් වැව් ලින් පතැස් ඈසිරින් යුත්
ගොඩපිටිය පටන් දෙව්ලෝසිරින් සව් සැපත් යුත්
මහතොටපුරදක්වා දූතුරේ මේ නොවී සිය්

11 සුදනදන, සජ්ජනයන්හා; යොවුන්පත්, යෞවනප්‍රාප්තවූ; කල්බඳුන්, කාන්තාවන්ද; පොල්, නාලිකේරද; පුවක්, ක්‍රමුකද; තල්, තාලද; වතු, වතුද; කුඹුරු, ක්‍ෂෙත්‍රද; ගෙවල්, ගෘහද; වැව්, වාපිද; ලින්පතැස්, ලින්භාපනැස්ද; සන, ඇ, මේ ආදිවූ; සිරින්යුත්, ඓශ්චර්‍ය්‍යයෙන්යුක්තවූ; ගොඩපිටියපටන්, ගොඩපිටියනම්වූ ග්‍රාමයෙහි පටන්; දෙව්ලෝසිරින්, දිව්‍යලෝකයෙහි ශ්‍රියාවෙන්; සව්සැපත්යුත්, සකලසම්පත්තියෙන් යුක්තවූ; මහනොටපුරදකා, මහාතීර්ථපුරයදක්වා; මෙදතුරේ, මේදෙපුරන්තරයෙහි; සිස්නොවී, අතරක්නැතුව.

12

රොන්ගණ්ණ නදදී බිඟුන් හෙළපියුම්පුල් රත්පියුම් නිල්උපුල්
ඇල්පැන් යුත් පිරිනිල්වලා ගඟදියේ සාදූදෙමල් තුන්මහල්
පස් සත් මාල ලකල්දහම් මඩුසඳ මෙන් දෙව්විමන් නන්සිරින්
හෙල්මැල්ලෙව් හෙළඹුල්දලෙව් හෙළසරෙව් බන්සේවියන්සේවෙ
(ලෙව්

12 බිඟුන්, භෘංගයන්විසින්; නදදී, නාදදනයකොට; රොන්ගණ්ණ, රේණුග්‍රහණයකරන්නාවූ; හෙළපියුම්, ශ්වේතපද්මද; පුල්, ප්‍රබුද්ධවූ; රත්පියුම්, රක්තපද්මද; නිල්උපුල්, නිලෝත්පලද ඇත්තාවූ; පිරි, සම්පූර්ණවූ; ඇල්පැන්යුත්, ශීතලජලයෙන්යුක්තවූ; නිල්වලා, නිල්වලානම්වූ; ගඟදියේ, ගඞ්ගාජලයෙහි; දෙමල්, ද්විභූමිකාවූද; තුන්මහල්, ත්‍රිභූමිකාවූද; පස්සත්මාල, පස්මාල් සත්මාලින්; ලකල්, අලඞ්කෘතවූ; දහම්මඩු, ධර්මමණ්ඩපයන්; සඳ, සර්ජනකොට; නන්සිරින්, නොයෙක්ශොභාවෙන්; දෙව්විමන්මෙන්, දිව්‍යවිමානමෙන්; සඳ, සරහා; හෙල්මැල්ලෙව්, කල්හාරවැනිවූද; හෙළඹුල්දලෙව්, හෙළඹුකුසුම්පත්‍රවැනිවූද; හෙළසරෙව්, සුදුනෙළුම් වැනිවූද; සේවෙලෙව්, ශ්වේතවලාහකවැනිවූද; සේවියන්, ශ්වේතවිතානයන්; බන්, බන්ධනයකරවා.

13

තැන්තැන්හිසැදිරන්තොරන්රඹතොරන්ගොප්පත්පිලිමල්තොරන්
රන්වන් රත් සුදු නිල් පිලි පටපිලි රත්නිල්පලස් කම්සඳ
නන්කම්යුත් සුපහන්ඇගෑ කරනොයෙක් නන්හි තඹා පුන්කලස්
එල්ලා රන්රසු දූල් කාසුන් දදනගා රන්දම් කුසුම් දම්සඳ

13 තැන්තැන්හි, ඒ ඒ ස්ථානයන්හි; රන්තොරන්, ස්වර්ණතොරණයන්ද; රඹතොරන්, කෙසෙල්තොරන්ද; ගොප්පත්, පුෂ්පගොබතොරණද; පිලි, පිලිතොරණද; මල්, මල්තොරණද; රන්වන්, ස්වර්ණවර්ණවූද; රත්සුදුනිල්, රක්තශ්වේතනීලවර්ණවූද; පිලි, පිලියෙන්ද; පටපිලි, පටපිලියෙන්ද; රත්නිල්, රක්තනීලවර්ණවූ පලස්, පලසින්ද; කම්සඳ, කර්මාන්තසර්ජනකොට; නන්කම්යුත්, නොයෙක්කර්මාන්තවලින් යුක්තවූ; සුපහන්ඇගෑකර, සහපත්ප්‍රදීපඅර්ඝකාකොට; නොයෙක්තන්හි, නානාස්ථාන

සන්ගී; පුන්කලස්, පූර්ණඝටයන්; තබා, ස්ථාපනයකොට; රන්රසුදල්, ස්වර්ණකිංකිණීක ජාලාවන්; එල්ලා, එල්ලමින්; රන්දම්, ස්වර්ණදාමහා; කුසුම්දම්, පුෂ්පදාමයන්ගෙන්; සද, සර්ජිතකොට; කසුන්දද, කාඤ්චන ධ්වජයන්; නගා, නන්වා.

14

(කෙහෙල්
ගින්තල්දෙතළ පොල් පුවක් තැඹිලි කොස්සල් දෙල්ඇඹුල්වේ
ලප්නාරන් විලිකුම්දෙළුම් අඹදොඩන් නාරන් සුපක්මේපෙලෙන්
රුක්මල්පුල්දුනුකේ කොබෝලිල පලොල්නාමල්පෙතන්දෑසමන්
රෙන්රැස් හෙල්මැලි රත්පියුම්හෙළපියුම් පුල්නිල්උපුල් මල්කමින්

14 ගින්තල්, ගින්භාතල්ය; දේතළ, දේතාළය; පොල්, නාලිකේරය; පුවක්, කුමුකය; තැඹිලි, සන්නීරය; කොස්, පනසය; සල්, සාලය; දෙල්, දෙල්ය; ඇඹුල්වේ, ගොරකය; කෙහෙල්, කෙසෙල්ය; ලප්නාරන්, නස්නාරන්ය; විලිකුම් දෙළුම්, පක්වදාඩිමය; අඹ, ආම්‍රය; දොඩන්, ජම්බිරය; නාරන්, නාරන්ය; යන, සුපක්, ඉතාඉදුනාවූ; මේපෙලෙන්, මේපෙළයන්ගෙන්; රුක්මල්, දුවගුපුෂ්පයන්ද; පුල්, ප්‍රබුද්ධවූ; දුනුකේ, රාජකේතකිය; කොබෝලිල, යූනපත්‍ර පුෂ්පය හෙවත් කොබෝලීලමල්ය; පලොල්, පාටලිය; නාමල්, නාගපුෂ්පය; පෙතන්, පෙතන්ය; දෑසමන්, ජාතිසුමනය; රෙන්රැස්, රේණුරාශීන්ඇතනාවූ; හෙල්මැලි, කල්හාරය; රත්පියුම්, කොකනදය; හෙළපියුම්, සුදුපියුම්ය; පුල්නිල්උපුල්, ප්‍රබුද්ධනිලෝත්පලය; යන, මල්කමින්, පුෂ්පකාමීයන්ගෙන්.

15

සක්දෙව් නිල්කට සිව්වරන් බඹ සවත් වත්අත්තලත් වෙන්කමල්
ගිම්රැස්සේකර දිත්ගුරු සුරගුරු සිත්තන් පෙලින් මේ සුරන්
ඇත් අස් ගෝ මුව සා මුවන් දිවි වලස් මේ සිව්පදන් රූසිරින්
රන්වන් හස් සමතුන් ගිරා ලිහිනියන් කෑරැල්සියොත් රූසිරින්

15 සක්දෙව්, ශක්‍රදේවයාය; නිල්කට, නීලකණ්ඨයාය; සිව්වරන්, සතරවරන්දෙවියන්ය; බඹ, බ්‍රහ්මයාය; සවත්, ස්කන්ධකුමාරයාය; වත්අත්, ගනදෙවියාය; තලත්, බලභද්‍රයාය; වෙන්, විෂ්ණුය; කමල්, ශ්‍රීකාන්තාවය; ගිම්රැස්, සූර්යයාය; සේකර, චන්ද්‍රයාය; දිත්ගුරු, ශුක්‍රයාය; සුරගුරු, බෘහස්පතිය,යන; මේසුරන්, මේදෙවියන්ගේ; සිත්තම්පෙලින්, චිත්‍රකර්ම පඞ්ක්තියෙන්ද; ඇත්, හස්තීන්ද; අස්, අශ්වයන්ද; ගෝ, ගවයන්ද; මුව, මෘගයන්ද; සාමුවන්, ශාඛාමෘගයන්ද; දිවි, ශාර්දූලයන්ද; වලස්, වලසුන්ද; යන මේසිව්පදන්, මේචතුෂ්පාදසත්වයන්ගේ; රූසිරින්, රූපශ්‍රීයෙන්ද; රන්වන් හස්, ස්වර්ණවර්ණ හංසයන්ද; සමතුන්, කොකිලයන්ද, ගිරා, ගිරවුන්ද, ලිහිනියන්, ලිහිනියන්ද; කෑරැල්, කෑරළුන්දයන, සියොත්, පක්ෂීන්ගේ, රූසිරින්, රූපශ්‍රීයෙන්.

16

දෙව්සෙන් පත්මනරම් සුරන් දෙව්විමන් මෙන් මේසියල්ලෙන් සරා
සාදූනන් ලකරින් අසුන් දෙකබැගින් ඒ දම් ගලන්හි සියත්
ඒ අස්නාන්හි සඟුන් වඩා ඉඳුවමින් තුන්සිත් පහන් විනිතින්
පින්වත් ඒසඟනන් ලවා මුනිවදන් දෙස්වන් නිමෙන් කන්අමා

16 දෙව්සෙන්පත්, දිව්‍යසේනාවපැමිනියාවූ; මනරම්, මනෝරම්‍යවූ; සුරන්, දේවතාවන්ගේ; දෙව්විමන්මෙන්, දිව්‍යවිමානයන් පරිද්දෙන්; මේසියල්ලෙන්, මෙකියනලදසියළුගෙදයින්ම; සරා, සරහා, සියල්ඒදම්හලන්හී, සියළුමඒධර්මසාලාවන්හී; නන්ලකරින්, නොයෙක් අලඞ්කාරයෙන්; අසුන්දෙකබැගින්, ආසනද්වයබැගින්; සාද, සජ්ජිතකොට; ඒඅස්නන්හී, ඒආසනයන්හී; සඟුන්වඩා, සඞ්ඝයාවැඩමවා; ඉඳුවමින්, නිසද්‍යකරවමින්; තුන්සිත්, ත්‍රිවිධචිත්තය; නිනින්පහන්වී, නිරන්තරයෙන්ම ප්‍රසන්නව; පින්වත්, පුණ්‍යවන්තවූ; ඒ සඟනන්ලවා, ඒ සඞ්ඝයාලවා; මුනිවදන්, සර්වඥවචනයන්; කන්අමාමෙන්, කර්ණාමෘතයක්මෙන්; දෙස්වන්නී, දේශනාකරවමින්.

17

විස්කම් දෙව්සලසේපඩව්වක ලකල් තුන්මල් ගෙයක් නන්සිරින්
සාදූරත් පලසින්රුවන් රසුදලින් දෙව් රූපෙලින්රණ් දෙදෙ න්
සිත්තම් සිත්බඳනා පලින් පලසඳ අත්තම් යොදා කම්කරු න්
පුන්මල් දම්කරණින් සරාවට තිරෙණ් රන්පත්රිදි පත්පෙලි න්

17 විස්කම්දෙව්, විශ්වකර්මදිව්‍යපුත්‍රයාවිසින්; කලසේ, නිර්මිතකලාක්මෙන්; පඩව්වක, ජලශාත්‍රාවෙක්හී; ලකල්, අලඞ්කෘතවූ; තුන්මල්ගෙයක්, ත්‍රිභූමිකගෘහයක්; නන්සිරිණ්, නොයෙක්ශොභාවෙන්; සාද, සර්ජිතකොට; රත්පලසින්, රක්තවර්ණපලසින්ද; රුවන්රසුදලින්, සවර්ණකින්කිනිකජාලාවන්ගෙන්ද; දෙව්රූපෙලින්, දිව්‍යරූපපන්තිවලින්ද; රන්දෙදෙන්, සවර්ණධවජයෙන්ද; සිත්බඳනා, චිත්තබන්ධනයකරන්නවූ; සිත්තම්, චිත්‍රකර්මයන්; පලින්පලසඳ, තැනින්තැනසර්ජිතකොට; කම්කරුන්, කර්මාන්තකාරයන්ගේ; අත්තම්, හස්තකර්මය; යොද, යෝජිතකොට; පුන්, ප්‍රබුද්ධවූ; මල්දම්කරණින්, මාලාදමකරණකොටගෙණ; වට, භාජ්පස්හි; තිරෙණ්, ජවනිකාවලින්ද; රන්පත් රිදිපත්පෙලින්, සවර්ණපත්‍රහා රජතපත්‍රපඞ්ක්තියෙන්ද; සරා, අලඞ්කෘතකොට.

18

නාන්කම් යුත් නිලිපුල්දමින් හෙලඹුලෙන් පුල්රත්නෙළුම්මල්දමින්
හෙල්මැල්ලෙන් සපුමල්දමින් සුමනාදම් යුත් [illegible]ම් පෙලින් පේකඩින්
සිව්රැස් සිව්දිග සිව් දොරින් ලියතුරින් රන්කම් රිදීකම් මුවා
සිව්කොන්හි දුහුලෙන් ලකල්ඛාර සඳුරන්මල් රිදී මල්සරා

18 නන්කම්යුත්, නොයෙක්කර්මාන්තයෙන්යුක්තවූ; හිළිපුල්දම්න්,
නීලෝත්පලදාමයෙන්ද; හෙළඹුලෙන්, කෙයූරයෙන්ද; පුල්, පිපුනාවූ;
රත්නෙළුම්මල්දමින්, රක්තපද්මමාලාදාමයෙන්ද, හෙල්මැල්ලෙන්, ක
ල්හාරයෙන්ද; සපුමල්දමින්, චම්පකමාලාදාමයෙන්ද; සුවනදම්, දාසමන්
මාලාදාමයෙන්ද; යුත්, යුක්තවූ; වැම්පෙලින්, ස්වර්ණපඞ්ක්තියෙන්හා; පේ
කඩින්, පේකඩයෙන්ද; සිව්දිග, සතරදික්හි; සිව්රැස්, සතරුස්වූ; සිව්දො
රින්, සතරදොරටුවෙන්ද; රන්කම්මුවා, ස්වර්ණකර්මාන්තමයවූ; රිදීක
ම්මුවා, රජතකර්මාන්තමයවූ; ලියතුරින්, ලතාවෘක්ෂයෙන්ද; සිව්කොන්
හි, කොන්සතරෙහි; දුනුලෙන්, දුකූලයෙන්; ලකල්කර, අලඞ්කෘතකො
ට; සද, සර්ජිතකොට; රන්මල්, රත්රන්පුෂ්පයෙන්ද; රිදීමල්, රජතපු
ෂ්පයෙන්ද; සරා, සරහා.

19

සාදා රන්කුඹු පොල්මලින් සුදු නිමල් රත් නිල් වැරැලෙලින් සරා
සිත්කල් දෙව්විමනෙව් සජා ලොවැදුරා දානන් වඩා සිත්බැතින්
සවිසත්දුක්මුහුදෙන්නගා ලනනැවක්මෙන් ලෝපසස්නා නිතින්
ඒදාගේමෙලෙසින්කලේ ගහට පත්සිත් සේපුදන්නී යලිත්

19 රන්කුඹු, ස්වර්ණකුම්භයන්; පොල්මලින්, නාලිකේරපුෂ්පයෙන්;
සාදා, සර්ජිතකොට; නිමල්, නිර්මලවූ; සුදුරත්නිල්, ශ්වෙතරක්තනීලව
ර්ණවූ; වැරැලෙලින්සරා, වස්ත්‍රපච්චිකාවෙන්සරහා; සිත්කල්, චිත්තකාන්
තවූ; දෙව්විමනෙව්, දිව්‍යවිමානයක්මෙන්; සරා, අලඞ්කෘතකොට; ලො
වැදුරා, ලෝකාචාර්යයන්වහන්සේගේ; දානන්, දාතූන්; සිත්බැතින්වඩා,
චිත්තභක්තියෙන්වැඩමවා; සවිසත්, සකලසත්වයා; දුක්මුහුදෙන්, දුඃඛන
මැතිසමුද්‍රයෙන්; නගාලන, ඵලප්‍රාප්තකරන්නාවූ; නිතින්, නිරන්තරයෙ
න්; ලෝ, ලොකයාවිසින්; පසස්නා, ප්‍රශංසනීයකටයුතුවූ; නැවක්මෙන්,
නෞකාවක්මෙන්; ඒදාගේ, ඒධාතුගෘහය; මෙලෙසින්, මෙම තුකීය නපර්
ද්දෙන්; සිත්සේ, චිත්තානුකූලලෙසට; පුදන්නී, පූජාකරමින්; ගහට, ග
ර්භාවට; පත්කලේ, ප්‍රාප්තකරණලදේවිය; යලිත්, නැවතද.

20

මන්සන්තොස්කරණ ලකල් හැමසිරිණ් දක්නාදනන්ගේසියල්
හම්බන් ඇදලයන්සජා වැඩිදූවා ඒ සවියනන්හි සඟුන්
ඒදාගේ අවටින් නිතින් පිරිවරා සිත්හි දිනුතොස්වඩා
පින්වත් ඒසහනන්ලවා මුනිවදන් දෙස්වන් තියම් සිත්තොසින්

20 මන්සන්තොස්කරණ, චිත්තසන්තෝෂකරන්නාවූ; ලකල්හැමසි
රිණ්, අලඞ්කාරසකලඓශ්වර්යයෙන්; හම්බන්ඇ, හම්බන්ආදිවූ; දලය
න්, ජලයාත්‍රාවන්; සරා, සරහා; ඒසවුයනන්හි, ඒසියළුයහනාවන්හී; සඟු
න්, සඞ්ඝයා; වැඩිදූවා, වැඩිඳුවා; ඒදාගේඅවටින්, ඒදාතුමන්දිරයට
හාත්පසින්; නිතින්, නිරන්තරයෙන්; පිරිවරා, පරිවාරකරවා; දක්නා,

දර්ශනයකරන්නාවූ; සියල්දනන්ගේ, සකලජනයන්ගේ; සිත්හිඳිනු, චින්තයෙහිපිහිටාවූ; තොස්වඩා, සන්තෝෂවර්ධනයකොට; පින්වත්, පුණ්‍යවන්තවූ; ජිනහනන්ලවා, ජිනබුද්ධස්වාමීන්වහන්සේලාලවා; මුනිවදන්, සර්වඥවචනයන්; නියම්, තුන්ගම්හි; සිත්තොයින්, චිත්තසන්තෝෂයෙන්; දෙස්වා, දෙශනාකරවා.

21

සක් සින්නම්සමගින් සවන් පිනවනා වීනා නලා වස්කුලල්
ගී රගම් මනරම් රැඟුන් තිරවියන් පන්දම් වැටුප් මල්කලස්
රන්කම්මල්වෙඩිඅත්වැටුප්කුඩකොඩිත්මේකීනොයෙක්නන්පුදෙන්
ඒ ඒ තන්හි නොයෙක් දහස් පුදටමේ පින්වත් පටන්ගත්සඳේ

21 සක්, ශඞ්ඛය; සින්නම්සමගින්, සින්නම්හාසමග; සවන්පිණවනා, කන්පිණවන්නාවූ; වීනා, වීණාද; නලා, නාඩිද; වස්කුලල්, වස්දඬුද; ගීරගම්, ගීතරාගද; මනරම්, මනෝරම්‍යවූ; රැඟුම්, නැටුම්ද; තිරවියන්, තිරහාවිතානද; පන්දම්වැටුප්, පන්දම්හා ප්‍රදීපද; මල්කලස්, පුෂ්පකලස්ද; රන්කම්, ස්වර්ණකර්මාන්තද; මල්වෙඩි, මල්වෙඩිද; අත්වැටුප්, අත්පහන්ද; කුඩකොඩිත්, ඡත්‍රහා ධ්වජදයන; මෙකි, මේකියනලද්දවූද; නොකී, නොකියනලද්දවූද; නන්පුදෙන්, නානාපූජාවෙන්; ඒ ඒ තන්හි, ඒ ඒ ස්ථානයන්හි; නොයෙක්දහස්පුදව, අනේකසහස්‍රපූජාපිණිස; මේ පින්වත්, මේ පුණ්‍යවන්තතුන්විසින්; පටන්ගත්සඳේ; ආරම්භකළකල්හි.

22 නොයෙක් සිරින් යුත් ගුණදම් සිහින්දුරු
දනෝ අසා ඒ පුද දා පිදුන් ලොබින්
සියල්දිගින් ගම්නිගමින් ඇවිත් ඇවිත්
සුරණ්රැසක් මෙන් ගඟපත් උනෝමෙසේ

22 ගුණදම්, ගුණධර්මයන්; සිහින්දුරු, චිත්තයෙන්දුරුවාවූ; නොයෙක් සිරින්යුත්, අනේකඓශ්වර්‍ය්‍යයෙන්යුක්තවූ; දනෝ, ජනයෝතුමූ; ඒ පුදඅසා, ඒ පූජාශ්‍රවනයකොට; දාපිදුන්ලොබින්, ධාතුපූජාලෝභයෙන්; ගම්නිගමින්, ග්‍රාමනිගමවලින්; සියල්දිගින්, සකලදිසාවෙන්; ඇවිත් ඇවිත්, ආගමනයකොටකොට; සුරණ්රැසක්මෙන්, දිව්‍යසමූහයක්ආකාරයෙන්; මෙසේ, මෙපරිද්දෙන්; ගඟ, ගඞ්ගාවට; පත්උනෝ, ප්‍රාප්තඋනෝය.

23

හෙල්මැල්ලක් විලසින් ඉතා සිනිඳුසුන් මල්දම් කලස් පොල් පුවක්
රත් හිල්සෙ පටවත් වියන් තොරණෑ ගෑ සැදු අඟුල් පාරුවෙන්
චූත් පුන්සේකර වන්රුවින් දිලිකතුන් ශූත්ගී රැඟුන් ගත් නලන්
ඊක්වි ගොස් එහි පත් නොයෙක් මැතිවරණ් දුගේ පසෙක්හි විශූ

23 වල්දම්, පුෂ්පදාමයෙන්ද; කලස්, පූර්ණඝටයෙන්ද; පොල්, නාලිකේර පුෂ්පයෙන්ද; පුවක්, ක්‍රමුකපුෂ්පයෙන්ද; රත්හිල්සේ, රක්තනීලශෛවල මෙන්වූ; පටවත්වියන්, පට්ටවස්ත්‍රවිතානයෙන්ද; තොරන්, තෝරණයෙන්ද; ඇගෑ, අර්ඝිකාවෙන්ද; සැදු, සර්ජනකළාවූ; හෙල්වැලලක්විලසින්; කල්හාර පුෂ්පාකාරවූ; ඉනාසිනිදසුන්, ඉනාසනිඛදශීනියඇතනාවූ; පුන්සේකරවන්, පූර්ණිමාචන්ද්‍රයාටබඳුවූ; වත්, වක්ත්‍රඇතනාවූ; රුවින්දිලි, රූපශ්‍රියාවෙන් දිප්තිමත්වූ; කතුන්යුත්, කාන්තාවන්සහිතව; ගිරැඟුන්ගත්, ගීතනෘත්‍යගතනාවූ; නලන්, නාටකයන්හා; අඟුල්පාරුවෙන්, අඟුල්පාරුවලින්; එක්වී, එකතුව; ගොස්, ගමනයකොට; එහිපත්, එහිපැමිණියාවූ; නොයෙක්මැතිවරන්, අනේකමන්ත්‍රීශ්වරයන්; දගේ, ධාතුගෘහයෙහි; පසෙක්හි, පාර්ශ්වයෙක්හි; විසූ, වාසයකළෝ.

24 නෙත්කල් තොරන් තිරවියන් කුසුමින් සරලා
හම්බන් පඬවි ඔරු නැගී මැතිඳුන් මිණන් නෙක්
සිත්කල් කතුන් දුසි දසුන් ඉඟිදත් නැනින් යුත්
කවි ගී දනන් පිරිවර එහි පත්උනෝ ගොස්

24 නෙත්කල්, නේත්‍රකාන්තවූ; තොරන්, තොරණයෙන්ද; තිරවියන්, තිරහා විතානයෙන්ද; කුසුමින්, පුෂ්පයෙන්ද; හම්බන්පඬවිඔරු, හම්බන්පඬවිද්‍රෝණීන්; සරලා, අලඞ්කෘතකොට; නැගී, ආරූඪව; නෙක්, නොයෙක්; මැතිඳුන්මිනන්, මන්ත්‍රීන්ද්‍රරත්නයන්; සිත්කල්, චිත්තකාන්තවූ; කතුන්, කාන්තාවන්ද; දුසි, දාසීන්ද; දසුන්, දාසයන්ද; ඉඟිදත්, අභිප්‍රායජානනයකළාවූ; නැනින්යුත්, ඥානයෙන්යුක්තවූ; කවිගිදනන්, කාව්‍යගීතිකාජනයන්ද; පිරිවර, පරිවාරකොට; ගොස්, ගමනයකොට; එහි, එතැන්හී; පත්උනෝ, ප්‍රාප්තවූවෝ.

25 හෙළතිරවියනින් සැදූ අඟුල්පාරුවෙන් ගොස්
සමහරු බෙර ගීරාගන් රැඟුන් ගත් දනන්හා
පමනට ලෙදමන් කාබී සැරිගොස් යොවුන්කත්
සමගිව මුනිඳුගේ දැබලා උන් පසෙක්හී

25 සමහර, ඇතම්කෙනෙක්; යොවුන්කත්සමගිව, යෞවනස්ත්‍රීන්සමග, ලෙදමින්පමනට; පොහොසත්ප්‍රමාණයට, කාබිසැරී; ඛාදනභෝජ්‍යපිලන්ධනයකොට, බෙර ගී රාගම්, භේරිගීතරාගම්හා; රැඟුන්, නාට්‍යය; ගත්, ග්‍රහනයකළාවූ; දනන්හා, ජනයන් සමග, හෙළතිරවියනින්; ශ්වේතජවනිකා විතානයන්ගෙන්; සැදු, සර්ජනකළාවූ; අඟුල්පාරුවෙන්, ද්‍රෝනිසන්ඝාටනතරණී වලින්; ගොස්, ගමනයකොට; මුණිඳගේ, මුණීන්ද්‍රයාගේ; දැබලා, ධාතුනිරීක්ෂණයකොට; පසෙක්හී, පාර්ශ්වයෙක්හී; උන්, නිසදනකළෝ.

26 නාකම් පතින් රඹගැබින් හෙළපොල් පතින්කම්
සාදා ඇතම් දනාකෙනෙක් ඔරු පාරුවෙන් ගොස්
එක්වී රබන් බෙරදැවුල් ගසනා දනන්හා
පත්වී ගොසින් එහිරැඳී සිටියෝ පසෙක්හී

26 නාකම් පතින්, නාගකණී පත්‍රයෙන් හෙවත් කැලපත්‍රයෙඳ; රඹ ගැබින්, රම්බාගර්භයෙඳ; හෙළපොල්පතින්, ධවලනාළිකේරපත්‍රයෙඳ; කම්, කර්මයන්; සාද, සර්ජනකොට; ඇතම්දන කෙනෙක්, සමහරජන කෙනෙක්; ඔරුපාරුවෙන් ගොස්, ද්‍රෝනිහා පාරුවලින් ගමනයකොට; රබන් බෙරදවුල්, රබඳබෙරද දවුල්ද; ගසනාදනන්හා, ගසන්නාවූජන යන්හා; එක්ව, එකතුව; ගොසින්, ගමනයකොට; එහිපත්ව, එතැන්හිපැමිණ; පසෙක්හි, පාශ්වීයෙක්හි; රැඳී, රඤ්ජිතව; සිටියෝ, සන්තවූහ.

27 ඇත්කන් පතින් රඹපතින් බුලතින් පතින් පොල්
රත්මල් කමින් ඔරුඅඟුල් සරහා සියන්හා
සිත්සේ නැගී සමහරුන් එහි ගොස් සැපත්වී
දගෙ බලා තුටුසිතින් සිටියෝ පසෙක්හී

27 ඇත්කන් පතින්, හස්තිකර්ණි පත්‍රයෙඳ; රඹපතින්, කෙසෙල්පත්‍රයෙඳ; බුලතින්, තාම්බූලයෙඳ; පොල්පතින්, පූගපත්‍රයෙඳ; රත්මල් කමින්, රක්ත පුෂ්පකර්මයෙඳ; ඔරුඅඟුල්සරහා, ඔරුඅඟුල් අලඞ්කෘත කොට; සියන්හා, ඥාතීන්හා; සමහරුන්, ඇතම්කෙනෙක්; සිත්සේනැගී, සිත්වූපරිද්දෙන් ආරූඪව; එහිගොස්, ඒස්ථානයටගොස්; සැපත්වී, සම්ප්‍රාප්තව; දගෙබලා, ධාතුගෘහය නිරීක්ෂනය කොට; තුටුසිතින්, තුෂ්ට චිත්තයෙන් යුක්තව; පසෙක්හි, ඒකපාශ්වීයෙක්හි; සිටියෝ, සිටියාහුය.

28 මාරුක් පතින් හෙළරිදී දලවන් සැරූනෙක්
හම්බන් පඩවි ඔරුනැගී සතුටින් කෙනෙක්යත්
එක්වි සියන් තුනුවසන් බරනින් සැරීලා
දූක්මෙන් ගඟේ සිරිගොසින් සිටියෝ පසෙක්හී

28 රිදිදලවන්, රජතපත්‍රසමානවූ; හෙළ, ශුද්ධවූ; මාරුක්පතින්, නාලිකේරපත්‍රයෙන්; සැරූ, අලඞ්කෘතකළාවූ; නෙක්, අනේකවූ; හම්බන්පඩවි ඔරුනැගී, හම්බන්හා පඩවි ඔරුවලට ආරූඪව; සතුටින්, සන්තෝෂයෙන්; කෙනෙක්, සමහරකෙනෙක්; යත්, ගමනයකරත්; තුනු, සැරීර; වසන්බරනින්, වස්ත්‍රාභරණින්; සැරීලා, අලඞ්කෘතකොට; සියන්, ඥාතීන් සමග; එක්වී, එක්ව; ගඟේසිරි, ගඞ්ගාවේශොභාව; දූක්මෙන්, දර්ශනයකිරීමෙන්; ගොසින්, ගමනයකොට; පසෙක්හි, ඒකපාශ්වීයක; සිටියෝ, සිටියාහුය.

29 පුළුපු හෙළසුනිල් පත් යුත් කොහෙල් ගැප් ඇඹුල් මල්
රතඹර කුසුමින්සැදු අඟුල් පාරු වෙන් නොත්
දිලිඳු දනාඹුවන් හා දුසුතන් එක් වෙලා ගොස්
එහි පසෙක රැඳු දූගෙ බලාවී පහන් සිත්

29 හෙළසුනිල්, ධවලවූද අතිනීලවූද; පුළුපුපත්යුත්, නාලිකේරපත්‍රයෙන් යුක්තවූ; කොහෙල්ගැප්, රම්භාගැබිද; ඇඹුල්මල්, ඔළුමලිද; රතඹරකුසුමින්, රක්තාම්බරපුෂ්පයෙද; සැදු, සර්ජනාකළාවූ; නෙක්අඟුල්පාරුවෙන්, නොයෙක්අඟුල්හාපාරුවලින්; දිලිඳු, දරිද්‍රවූ; දන, ජනයන්; අඹුවන්හා, අම්බිකාවන්හා; දුසුතන්, දුහිතෘද පුත්‍රයද; එක්වෙලා, එකතුව; ගොස්, ගමනයකොට; දූගේබලා, ධාතුමන්දිරය නිරීක්ෂණයකොට; සිත්පහන්වී, චිත්තප්‍රසන්නව; එහිපසෙක, එහිපාර්ශ්වයෙක්හි; රැඳු, රජිනවූහ.

30 සැරු අඟුල් පාරු පුළුප් මලින් පලින්
නැගි අවුත් පත්දිගැසින් වතින් නෙතින්
ගඟේ පියුම් මින්නොදැනි වෙනස් වෙසෙස්
කුහුල් එදාපත් නොහලෝ දනන් මෙනෙන්

30 පුළුප්මලින්පලින්, නාලිකේරපුෂ්පයෙන්හා ඵලයෙන්; සැරු, සැරසුවාවූ; අඟුල්පාරු, අඟුල්පාරුවල; නැගි, ආරූඪව; අවුත්පත්, ආගමනයකොට පැමිණියාවූ; දිගැසින්, ස්ත්‍රීන්ගේ; වතින් නෙතින්, වක්ත්‍රනේත්‍ර කරණකොටගෙන; ගඟේ, ගඞ්ගාවෙහි; පියුම්, පද්මයන්ගේද; මින්, මත්ස්‍යයන්ගේද; වෙනස් වෙසෙස්, වෙනස්විශෙෂය; නොදැනි, දැනගතනොහී; එදා, ඒදවස්හී; පත්, පැමිණියාවූ; කුහුල්, කෝතූහලභාවය; දනන්, ජනයෝ; මෙනෙන්, චිත්තයෙන්; නොහලො, නොහැරියාහුය.

31 නම් ගම් ලැබුමැතිවරන් සමගින් දනැ ත්තෝ
නම් ගොත් පසන් පරපුරෙන් පැවතා කුලැත්තෝ
සව් සත් බලා ලොවසිරිත් දැනගත් තැනැ ත්තෝ
සිත්සත් ගුණෙන් යුතු දහම් අසනා කැමැ ත්තෝ

31 නම්ගම්, නාමයන්හා ග්‍රාමයන්; ලැබූ, ලැබුවාවූ; මැතිවරන්සමගින්, අමාත්‍යවරයන්හා; දනැත්තෝ, ධනවන්තයෝද; නම්ගොත්, නාමගෝත්‍රයෙන්; පසන්, ප්‍රශංසනීයවූ; පරපුරෙන්පැවතා, පරම්පරාවෙන්පැවතආවාවූ; කුලැත්තෝ, වංශඇත්තෝද; සව්සත්, සකලශාස්ත්‍ර; බලා, අවලෝකණයකොට; ලොවසිරිත්, ලෝකචාරිත්‍ර; දැනගත්තැනැත්තෝ, ජානනයකළතැනැත්තෝද; සිත්, සිත්හී; සත්ගුණෙන්යුතු, ශෝභනගුණයෙන්යුක්තවූ; දහම්, ධර්මය; අසනාකැමැත්තෝ, ශ්‍රවණයට රුචිඇත්තෝද.

32 පර සිදු පුරවැස්සන් පින්කිරිමෙම රිය් සන්
යුදෙහි නොපසු බැස්සන් ලෙව් නොයෙක් දේට නිස්සන්
පබුදන අත වැස්සන් ගම් විසු සැම වැස් සන්
සමගිව දූසිදූස්සන් නන් පසස් නුන සෙස් සන්

32 පරසිඳු, ප්‍රසිද්ධවූ; පුරවැස්සන්, නගරවාසීන්ද; පින්කිරිමෙම, පුණ්‍යක්‍රියාවෙහිම; රිස්සන්, ඉච්ඡාවන්තයන්ද; යුදෙහි, යුධයෙහි; නොපසු බැස්සන්, පසුබට නුවූවන්ද; ලෙව්, ලෝකයෙහි; නොයෙක් දේටනිස්සන්, නොයෙක්දේවලට සුදුස්සන්ද; පබුදන, ප්‍රබුජනයන්ගේ; අතවැස්සන්, අන්තේවාසිකයන්ද; ගම්විසුසැමවැස්සන්, ග්‍රාමවාසීසියල්ලන්ද; දූසි, දූසින්ද; දූස්සන්, දූසයන්ද; නම්, නාමයෙන්; පසස්නුන, ප්‍රසිද්ධනුවූ; සෙස්සන්, අවශේෂජනයන්; සමගිව, ඒක්ව.

33 තරුණ දන යොවුන් වස් පත් විරුම් කම් කරුන්නේ
කුමරු කුමරියන් සිත් කල්කතුන් ඇසියල් ලන්
පහුරු ඔරු අගුල් හම් බන් පඩව් පාරුවෙන් ගොස්
එ ගඟ තුරුනොව් රැස් වි විසූ ඒ පුද දා

33 තරුණදන, තරුණජනයන්ද; යොවුන්, යෞවනීන්ද; වස්පත්, වයසටපැමිණියාවූන්ද; විරුන්, වීරයන්ද; නේකම්කරුම්, නොයෙක්කර්මාන්තකාරයන්ද; කුමරුකුමරියන්, කුමාරයන්හා කුමාරිකාවන්ද; සිත්කල්, චිත්තාලයවන්තාවූ; කතුන්, කාන්තාවන්දයන; ඇසියල්ලන්, මේආදිසියල්ලන්ම, පහුරුඔරු, පහුරුහාඔරුද; අගුල්හම්බන්, අගුල්හාහම්බන්ද, පඩව්පාරුවෙන්, පඩවිහාපාරුවෙන්ද; ගොස්, ගමනයකොට; එගඟ, ඒගඟාමෙනි; අතුරුනොව්, අතුරුසිදුරුනොව; රැස්වී, රාශිව; ඒදපුද, ඒධාතුපූජාකාලයෙහි; විසූ, වාසයකළාහුය.

34 දෙව් නැව් නැගි සුර ගණේ මුරුසෙන් ලෙසින් පත්
කව් ගි රැගුම් වෙන වැයුම් සමගින් දනන් පත්
ඒ නිල් වලා ගඟදියේ ඔරු පාරු හම්බන්
පත්නු තැනක් කොල වරක් මෙතෙකැය් ගනන් නැත්

34 දෙව් නැව් නැගී, දිව්‍යනෞකාරූඪව; සුරගණේ, ආකාශගඞ්ගාවට; පත්, පැමිණියාවූ; මුරුසෙන්ලෙසින්, දිව්‍යසේනාවක්පරිද්දෙන්; කව්ගි, කාව්‍යයෙන්හා ගීතිමෙන්ද; රැඟුම්, නාට්‍යයන්ද; වෙනවැයුම් සමගින්, වීණාවාදනකිරීමහා සමග; පත්දනන්, පැමිණිජනයන් විසින්ගැවසීගත්තාවූ; ඔරුපාරුහම්බන්, ඔරුහා පරුදහම්බන්ද; ඒ නිල්වලා ගඟදියේ, ඒ නිල්වලාහකගඞ්ගාජලයෙහි; පත්නුතැනක්, අසම්ප්‍රාප්තස්ථානයක්ද; කොලවරක්, කොනක්ද; මෙතෙකැය්, මෙපමණයයි; ගනන්, සංඛ්‍යාවක්; නැත්, නැත්තේයි.

35 පෝමන් ලෙසින් පුම්තිරින් සැරසී මනාසේ
රැස්වී ගඟේ දෙතෙර දෙව් සෙනඟක් ලෙසින් පත්
දැක්වා අනුන් අදරපත් සුවදුක් අසාලා
උන්නාන් නොයෙක් සියදහස් සිවියන් ගනන්නැත්

35 පෝමන්ලෙසින්, පොහොසත්ආකාරයෙන්; පුම්තිරින්, පුරුෂයන් හා ස්ත්‍රීන්; මනාසේ, යහපත්පරිද්දෙන්; සැරසී, අලඞ්කෘතව; රැස්වී, රාශිභූතව; ගඟේ, ගඞ්ගාවෙහි; දෙතෙර, උභයතීරයෙහි; දෙව්සෙනඟක් ලෙසින්, දිව්‍යසේනාවක් පරිද්දෙන්; පත්, ප්‍රාප්තව; අනුන්, අන්‍යයන්ට; අදරදක්වා, ආදරපෙන්වා; පත්, පැමිණියාවූ; සුවදුක් අසාලා, සුඛදුඃඛවිචාරා; උන්නන්, උන්නාවුන්ගේද; නොයෙක්සියදහස්, අනේකශතසහස්‍රයක්; සිවියන්, සිවියාවුන්ගේද; ගනන්නැත්, සංඛ්‍යාවක්නැත්තේය.

36 යුතුනෙක සුසිරිත් දහම් එකල්හි
ගහ වොරුවෙන් අහුලෙන් සැපත් උනුන් ගේ
ගඟ දෙපසගොඩින් ඇවිත් පතුන් ගේ
විතර වෙසෙස් කියතොත් ඉතා බොහෝවි

36 නෙකසුසිරිත් දහම්යුතු, අනේකසුචරිතධර්මයෙන් යුක්තවූ; එකල්හී, එසමයෙහි; ගහට, ගඞ්ගාවට; ඔරුවෙන්අහුලෙන් සැපත්, ඔරුවෙන් හා අහුලෙන් පැමිණියාවූ; උනුන්ගේ, ඔවුනොවුන්ගේද; ගඟදෙපස, ගඞ්ගාඋභයපාර්ශ්වයට; ගොඩින්ඇවිත්, ගොඩින්ආගමනයකොට; පතුන්ගේ, පැමිණියාවුන්ගේද; විතරවෙසෙස්, විස්තරවිශේෂය; කියතොත්, කථනයකරතහොත්; ඉතාබොහෝවි, අතිශයින්බහුලවේ.

[illegible]7 තෙල් මල් පහන් සුවඳදුම් සඳුනෙන්පුදන් නෝ
අත් දී මුදුන් සවනම්‍රා සදහම් අස   න් නෝ
දත්දම්අරුත් විමසමින් තුටුසිත් වඩ   න් නෝ
රැස්වී පලින් පලතිදස් පුරමොක් පතන් නෝ

37 තෙල්, තෛලයෙන්ද; මල්, පුෂ්පයෙන්ද; පහන්, ප්‍රදීපයෙන්ද; සුවඳදුම්, සුගන්ධධූමයෙන්ද; සඳුනෙන්, චන්දනයෙන්ද; පුදන්නෝ, පූජාකරන්නෝද; මුදුන්, මස්තකයෙහි අත්දී, හස්තදානයකොට; සවනම්‍රා, කර්ණාමෘතවූ; සදහම් අසන්නෝ, සද්ධර්මශ්‍රවණයකරන්නෝද; දත්, දැනගත්තාවූ; දහම්අරුත්, ධර්මාර්ථයන්; විමසමින්, විමංසනයකරමින්; තුටුසිත්වඩන්නෝ, තුෂ්ටචිත්තවර්ධනයකරන්නෝද; පලින්පල, ඵලතන්හි; රැස්වී, රැස්ව; තිදස්පුර, ත්‍රිදශපුරයද; මොක්, මොක්ෂයද; පතන්නෝ, ප්‍රාර්ථනාකරන්නෝද.

38 නන්කම් තැනින් තැන ගොසින් විමසා බල න්නෝ
එක්වී පෙලින් පෙලසැදී වෙසෙසුන් වන න්නෝ
නන්වෙස් දරමිරිදුයි කිය මින් නට න්නෝ
දැක්මෙන් අනුන් සිතදරින් බුහුමන් කර න්නෝ

38 නන්කම්, නොයෙක්කර්මාන්තයන්; තැනින්තැන, තන්හිතන්හී;
ගොසින්, ගමනයකොට; විමසාබලන්නෝ, පරීක්ෂාකොට බලන්නෝය;
පෙලින්පෙල, පඞ්ක්තියෙන් පඞ්ක්තිය; එක්වී, එකතුව; සැදී, සර්ජිතව;
වෙසෙසුන්, විශෙෂයන්; වනන්නෝ, වර්ණනාකරන්නෝද; නන්වෙස්ද
රා, නොයෙක්වේශධාර්ව; මිරිදුගීකියමින්, මිරිදුගීතිකාකියමින්; නටන්
නෝ, නෘත්‍යකරන්නෝද, දැක්මෙන්අනුන්, අන්‍යයන්දර්ශනයකිරීමෙන්;
සිතදරින්, චිත්තාදරයෙන්; බුහුමන්කරන්නෝ, බහුමානකරන්නෝද.

39 මල්කත් අරන් වහවහා සතුටින්දුව න්නෝ
පොල්තෙල් පිරූකලබදුන්ගෙන ගොස් තබන්නෝ
දැල්වූ පහන් ඉසතබා නිසලී සිටි න්නෝ
මල්පැස් පුරාගෙණ ගොසින් එපවත් කිය න්නෝ

39 මල්කත්, පුෂ්පකාජයන්; අරන්, හැරගෙණ; වහවහා, සීඝ්‍රව සීඝ්‍ර
ව; සතුටින් දුවන්නෝ, සන්තුෂ්ටයෙන්ධාවනයකරන්නෝද; පොල්තෙ
ල්පිරූ, නාලිකේරතෛලපූර්ණයකළාවූ; කලබඳුන්ගෙණ, ඝටභා භාජ
න ග්‍රහණයකොට; ගොස්තබන්නෝ, ගමනයකොටතිබන්නෝද; දැල්වූ,
දල්වනලද; පහන්, ප්‍රදීප; ඉසතබා, මස්තකයෙහිතබාගෙණ; නිසලී, නි
ශ්චලව; සිටින්නෝ, නිසද්දවූවෝද; මල්, පුෂ්පයන්; පැස්පුරාගෙණ, පැ
සෙහිපූර්ණයකොටගෙණ; ගොසින්, ඇරගෙණගොස්; එපවත්, ඒප්‍රවෘ
ත්තිය; කියන්නෝ, කථනයකරන්නෝද.

40 පන්සිල් ගණිවි බණඅසවී අඩගා කිය න්නෝ
බත්පැන් බුලත්කව පොවය් කියමින් බෙදන්නෝ
අල්ලාකතුන් දරුවනුත් බැහැරින් සිටි න්නෝ
දුක්වීඇතම් ලදරුවන් නැහිවි සොය න්නෝ

40 පන්සිල්ගණිවි, පඤ්චශීලයග්‍රහණයකරවිය; බණඅසවි, ධර්මශ්‍රව
ණයකරවිය; අඩගාකියන්නෝ, අඬගසාකියන්නෝද; බත්පැන්, භක්ත
පානීයද; බුලත්, තාම්බූලද; කවපොවය්, අනුභවකරව පානයකර්වයකි
යා; කියමින් බෙදන්නෝ, කථනයකරමින් බෙදන්නෝද; කතුන්, කාන්
තාවන්හා; දරුවනුත්, දරකයනුත්; අල්ලා, අල්වාගෙණ; බැහැරින් සි
ටින්නෝ, බාහ්‍යයෙන්ස්ථිතවන්නෝද; ඇතම් ලදරුවන්, සමහර ළදරු
කෙනෙක්; නැහිවි; නැඟිව; දුක්වී, දුඃඛයටපැමිණ; සොයන්නෝ, පරී
ක්ෂාකරන්නෝද.

41 දල්වව්පහන් පුදව මල් නෙපලින් බනන්නෝ
සිල්වත් දනන් වෙත ගොසින් සුවදුක් අසන්නෝ
වත්කම් මදින් පුදකිරීමට සිත් තැවෙන්නෝ
දන්නා දහම්ගැටඅරුත් පවසා අසන්නෝ

41 පහන්දල්වව්, ප්‍රදීපදල්වව්ය; මල්පුදව, පුෂ්පපූජාකරව්යයි; නෙපලින්, වමනයෙන්; බනන්නෝ, කථනයකරන්නෝද; සිල්වත්, සීලවන්තවූ; දනන්වෙත, ජනයන්කෙරෙහි; ගොසින්, ගමනයකොට; සුවදුක් අසන්නෝ, සුඛදුඃඛවිචාරන්නෝද; පුදකිරීමට, පූජාකිරීමපිණිස; වත්කම්මදින්, පොහොසත්මදි බැවින්; සිත්තැවෙන්නෝ, චිත්තතාපනයවන්නෝද; දන්නා, ඥානනයකළාවූ; දහම්ගැටඅරුත්, ධර්මග්‍රන්ථිඅර්ථයන්; පවසා, ප්‍රකාශකොට; අසන්නෝ, විචාරන්නෝද.

42 ගිව්කණ් පලන් බරණතින් ගලවා පුදන්නෝ
රන්මල් රිදී මලදරින් ගෙණ ගොස් ඉසින්නෝ
තල්පොල් පුවක්වළු කපා ගෙණ ගොස් බදින්නෝ
සාදනොයෙක් ගදපදින් තිසුගී කියන්නෝ

42 ගිව්කණ්, ග්‍රීවකර්ණයෙහි; පලන්බරණ, පිලඬිනයකළාවූ ආභරණයන්; අතින්, හස්තයෙන්; ගලවා පුදන්නෝ, ගලිතකරවාපූජාකරන්නෝද; රන්මල්, රත්රන්මල්හා; රිදීමල්, රජතපුෂ්පයන්; අදරින්ගෙණ ගොස්, ආදරයෙන්හැරගෙණ ගොස්; ඉසින්නෝ, ආසිචනයකරන්නෝද; තල් පොල් පුවක් වළු, තල්වළුද පොල්වළුද පුවක්වළුද; කපාගෙණ ගොස්, කපාහැරගෙණ ගොසින්; බදින්නෝ, බන්ධනයකරන්නෝද; සාද, සර්ජිතකොට; නොයෙක්ගදපදින්, අනේකගද්‍යපද්‍යයෙන්; තිසුගී කියන්නෝ, ස්තුතිගීතිකාකථනයකරන්නෝද.

43 සැරිනොයෙක් රන්බරණින් ගමින් ගමින්
බොහෝදෙනා සත්දනයෝ ඇවිත් ඇවිත්
දෙතුන්සැරේ මල්පුදමින් වෙනින් වෙනින්
දහම්ලොබින් සත්සිරියෝ වටින් පිටින්

43 නොයෙක්රන්බරණින්, අනේකසුවර්ණාභරණයෙන්; සැරී, සර්ජිතව; ගමින් ගමින්, ගම් ගම්වලින්; සත්දනයෝ, සත්පුරුෂ ජනයෝ; බොහෝදෙන, බොහෝදෙනා; ඇවිත් ඇවිත්, ආගමනයකොටකොට; දෙතුන්සැරේ, දෙතුන්විටක්; වෙනින් වෙනින් මල්පුදමින්, වෙන වෙන පුෂ්පපූජාකරමින්; සත්, ශොභනවූ; දහම්ලොබින්, ධර්මලෝභයෙන්; වටින් පිටින් සිටියෝ, වටින් පිටින් සිටියාහුයි.

41 කෙනෙක් අහෝ සාදු කියා නිවන් පැතූ
කෙනෙක් සතොස් නෙත් කඳුලෙන් තෙමී ගියෝ
දෑහොත් මුදුන්දී බැනැඳු ඇතම් කෙනෙක්
බැලූලකල් නෙත්පොලඹා ඇතම් කෙනෙක්

44 කෙනෙක්, සමහරකෙනෙක්; අහෝසාධුකියා, අශේයහපතකියා; නිවන්, නිර්වාණය; පැතූ, ප්‍රාර්ථනාකළාහුය; කෙනෙක්, ඇතම් කෙනෙක්; සතොස්නෙත්කඳුලෙන්, සන්තෝෂනේත්‍ර බාෂ්පයෙන්; තෙමීගියෝ, ආර්ද්‍රවගියාහුයි; ඇතම් කෙනෙක්, සමහරකෙනෙක්; දෑහොත්, හස්තද්වය; මුදුන්දී, මස්තකයෙහි ස්ථාපනයකොට; බැනැඳු, ධර්මශ්‍රවණයකළාහුය; ඇතම් කෙනෙක්, සමහරකෙනෙක්; ලකල්, මනෝඥවූ; නෙත්පොලඹා නේත්‍රලෝභකොට, බැලූ, නිරීක්ෂණයකළාහුයි.

45 සුදම් සබා පත් සුරසෙන් ලෙසින් තොසින්
එදම් සබාපත් මැතිසෙන් දෙසින් දෙසින්
සදම් අසාසිත් පිණමින් නිතින් බැතින්
අදම් හලෝසිත් සතනින් මුදු එදු

45 සුදම්සබා, සුධර්මානම්දිව්‍යසභාවට; තොසින්, සන්තෝෂයෙන්; පත්, පැමිණියාවූ; සුරසෙන්ලෙසින්, දිව්‍යසේනාවක්මෙන්; දෙසින් දෙසින්, ඒඒදිශාවෙන්; එදම්සබා, ඒධර්මසභාවට; පත්, පැමිණියාවූ; මැතිසෙන්, අමාත්‍යසේනාව; බැතින්, භක්තියෙන්; නිතින්, නිරන්තරයෙන්; සදම්අසා, සද්ධර්මශ්‍රවණයකොට; සිත්පිණමින්, චිත්තප්‍රීණනයවෙමින්; එදු, එදවස්හි; අදම්, අධර්මයන්; සිත්සතනින්, චිත්තසන්තානයෙන්; මුදු, මුක්තකොට; හලෝ, හැරියාහුය.

46 නැබු දෑහොත් සිත්පිණමින් සිරෙ සිරේ
නිතින් රැඳුපත් කඩයුත් උරෙ උරේ
දුරු නොයෙක් සිල්පද සිත් තුරේ තුරේ
සතන් පහන් සිත් සදහම්කෙරේ කළෝ

46 සිරේ සිරේ, මස්තකයක් මස්තකයක්පාසා; සිත්පිණමින්, චිත්තප්‍රීණනයකරමින්; දෑහොත්නැබු, හස්තයුග්මයන්නැඹුවාහුය; උරේ උරේ, උරයක් උරයක්පාසා; නිතින්, නිරන්තරයෙන්; රැඳු, රඳාපීවූ; පත්කඩයුත්, පත්කඩින් යුක්තවූ; සිත්තුරේතුරේ, චිත්තාන්තරයක් චිත්තාන්තරයක්පාසා; නොයෙක්සිල්පද, අනේකශික්ෂාපද; දුරු, දුරුවාවූ; සතන්, සත්වයන්; සදහම්කෙරේ, සද්ධර්මයකෙරෙහි; සිත්පහන්කළෝ, චිත්තප්‍රසන්න කළෝ.

47

සමගින් මේහැම සත්දනන් මෙමැතිඳුන් කෙත්වත් ගෙවල්රන්රිදී
සුදු රන් නිල්පටවත් පලස් හිරවියන් රන්දම් කුසුම් දම්වැටුප්
කුඹසේ සත්දසී දාස්වහන් මුතුමැණික් ගෝමිසරක් රන්බඳුන්
බුදුවූදා සුරසෙන් පිදුපුදලෙසින් මේ කී සියල්ලෙන් පුදත්

47 මේහැමසත්දනන්සමගින්, මේ සියළුසජ්ජනයන්හා සමග; මෙමැතිඳුන්, මේ මන්ත්‍රීන්ද්‍රයාද; කෙත්වත්, ක්ෂේත්‍රවස්තූන්ද; ගෙවල්, ගෘහයන්ද; රන්, රත්රන්ද; රිදී, රජතද; සුදුරත්නිල්, ශ්වේතරක්තනීලවර්ණවූ; පටවත්පලස්, පට්ටවස්ත්‍රහාපලස්ද; හිරවියන්, හිරහාවිතානද; රන්දම් කුසුම්දම්, ස්වර්ණදාමහා පුෂ්පදාමද; වැටුප්, ප්‍රදීපද; කුඹසේසත්, කුඹහා ශ්වේතච්ඡත්‍රද; දාසිදාස්, දාසිදාසයන්ද; වහන්, සෙරෙප්පුද නොහොත් වාහනද; මුතුමැණික්, මුක්තාමාණික්‍යද; ගෝමිසරක්, ගවමහිසයන්ද; රන්බඳුන්, රත්රන්භාජනද; යන, මෙකීසියල්ලෙන්, මෙකියනලදසියළුවස්තූන්ගෙන්; බුදුවූද, බුඩත්වයටපැමිණිකල්හි; සුරසෙන්පිඳු, දිව්‍යසේනාවන් පූජාකළාවූ; පුදලෙසින්, පූජාආකාරයෙන්, පුදත්, පූජාකරණකල්හි.

48 ගිම්රුස් සහස් පත පුදා පැලදික් මලස්නේ
සේරුස් වටාපත අරන් පෙරදික් මදෙස්නෙන්
රත්වන් වලා රතඹරින් සැරසී වසාගත්
පත්වී තවුස් සිරිදරා සඳකල් එකල්හි

48 ගිම්රුස්, සූර්‍ය්‍යනමැති; සහස්පත, සහශ්‍රපත්‍රය; පැලදික්, පශ්චිමදික්නැමති; මල්අස්නේ, පුෂ්පාසනයෙහි; පුදා, පූජාකොට; සේරුස්, චන්ද්‍රනමැති; වටාපත, විජනිය; පෙරදික්, පූර්වදිශානමැති; මදෙස්නෙන්, මන්ජූසයෙන්; අරන්, ග්‍රහණයකොට; රත්වන්වලා, රක්තවර්ණාභ්‍රනමැති; රතඹරින්, රක්තවස්ත්‍රයෙන්; ගත්, ශරීරය; වසා, අච්ඡාදනයකොට; සැරී, අලංකෘතව; සඳකල්, සන්ධ්‍යානමැතිකාන්තාතොමෝ; එකල්හි, එසමයෙහි; තවුස්සිරිදරා, තාපසශ්‍රීධාරණයකොට; පත්වී, ප්‍රාප්තාවිය,

49 සඳවෙල පලසින් පුදන් නියක් මෙන්
සඳ කතපත් සබකත් බලා එකල්හි
පවල හරකඩා තමන්ගෙලේ බන්
විදුල සිරින් පලවී පහන් පිදුම්වස්

49 සඳවෙල, සන්ධ්‍යාවලාහකනැමති; පලසින්, ආස්තරණවස්ත්‍රයෙන්; පුදන්නියක්මෙන්, පූජාකරන්නියක් පරිද්දෙන්; පත්, පැමිණියාවූ; සඳකත, සන්ධ්‍යානාමැතිකාන්තාව; එකල්හි, ඒකාලයෙහි; සබකත්බලා, ස

භානමැතිකාන්තාවනිරීක්ෂණයකොට; තමන්ගෙලේ, තමන්ගේග්‍රීවයෙහි; බන්, බන්ධනයකළාවූ; පවලහර, ප්‍රවාලහාරය; පිදුම්වස්, පූජාපිණිස; සාඩා, ඡේදනයකොට; විසුලසිරින්, විශාලශ්‍රීකළාවූ ශ්‍රීයාවෙන්; පහන්, ප්‍රදීපයෝ; පළවී, ප්‍රකාශවිය.

50 පිණාවන සඳහම්අමා කහින්ගත්
තිදූකර මීකාන සිත් තොසින් එකල්හි
පුදටෙසි වැඩවෙය් සිතා පියුම්රා
මිණිවිසු ලෙවි පළවි පහන් කැළුම්යුත්

50 පිණාවන, පිණානකරවන්නාවූ; සදහම්අමා, සද්ධර්මාමෘතය; කහින්ගත්, කාණ්ඩයෙන්ග්‍රහණයකළාවූ; මීකාන, මිහිකාන්තාවවිසින්; සිත් තොසින්, චිත්තසන්තෝෂයෙන්; තිදුකර, ස්තුතිකොට; එකල්හී, එවිට; එහිපුදට, එහිපූජාපිණිස; වැඩවෙය්සිතා, ප්‍රයෝජනයවෙයිචින්තනය කොට; පියුම්රගමිණි, පද්මරාගමාණික්‍යයන්; විසුලඑවි, විශාලකළඅාකාරයෙන්; කැළුම්යුත්, කාන්තියෙන්යුක්තාවූ; පහන්, ප්‍රදීපයෝ; පළවී, ප්‍රකාශවිය.

51 නෙත් සිත් සතොස් වනලකල් ඔරු පාරුවෙන් පත්
දෙව් කාත් සිරින් දිලියොවුන් මනකල් කතුන්ගේ
වත් නෙත් සිරින් ගහ පියුම් නිලිපුල් එකල්හි
මෙන් පත් විලින් මිලිසිරින් දුටුවන් නුවන්ගත්

51 නෙත්සිත්, නේත්‍රචිත්තයන්; සතොස්වන, සන්තෝෂවනනාවූ; ලකල්, අලඞ්කෘතවූ; ඔරුපාරුවෙන්පත්, ඔරු පාරුවලින් පැමිණියාවූ; දෙව්කාත්සිරින්, දිව්‍යකාන්තාවන්ගෙශොභාවෙන්; දිලි, දීප්තිමත්වූ; යොවුන්, යෞවනවූ; මනකල්, මනොඥවූ; කතුන්ගේ, කාන්තාවන්ගේ; වත්නෙත්සිරින්, වක්ත්‍රනේත්‍රශ්‍රියාවන් කරණකොටගෙණ; ගහ, ඒගඞ්ගාවෙහි; පියුම්, පද්මයන්හා; නිලිපුල්, නීලෝත්පලයන්; එකල්හි, එසමයෙහි; පත්විලින්මෙන්, ප්‍රාප්තලජ්ජාවෙන්මෙන්; මිලිසිරින්, ම්ලානිකාකාරයෙන්; දුටුවන්, දර්ශනයකළවුන්ගේ; නුවන්ගත්, නේත්‍රග්‍රහණයකළේ.

52

සඳකැන්මි සඳකත්උරා බොනුබලා රැඹූදිගැඹ සිත්රොසින්
මකාඳඅත් පා හසිමින් තමස් සමගුරත් සොල්වා සැපත්වත්සෙදින්
සැඩරැස් රත්මිණ රත්වලා රතඹරත් ගන්මින් දුවත් ඇදිලී
තුරුරැස් මීබිදුවන් ඉසි ශිගරිදී විත්වන් දුමූ සේකාර

52 සඳකත්, සඞ්ඛ්‍යානමැතිකාන්තාවවිසින්; සඳකැන්මි, සඞ්ඛ්‍යාකාන්තිනමැතිමධුව; උරා, ආකර්ෂණයකොට; බොනු, පානයකිරීම; රැඹූදිගැ

ස්, රාත්‍රිනමැතික්ෂණිහොමෝ; බලා, නිරීක්ෂණයකොට; සිත්රොසින්, චිත්තරෝසයෙන්; කොඳදත්පා, කෞමුදනමැති දන්තාන්තප්‍රකාශකොට; හසිමින්, හාස්‍යකරමින්; තමස්, අන්ධකාරනමැති; සමුඳුරන්, සමුද්‍රගරය; සොල්වා, චාලනයකොට; සෙදින්, සීඝ්‍රව; සැපත්වන්, සම්ප්‍රාප්තවනකල්හි; සැඩරැස්, සූර්‍යනාමැති; රත්මිණ, රත්නමාණික්‍යද; රත්වලා, රක්තවලාහකනමැති; රතඹරන්, රක්තවස්ත්‍රද; ගන්මින්, ග්‍රහණයකොට; ඈ, ඒසන්ධ්‍යානමැති ස්ත්‍රී; දුමන්, ධාවණයකරණකල්හි; දිලි, දීප්තිමත්වූ; තුරුරැස්, තාරකාරාශිය; ඉසිගිය, ඉසිරීගියාවූ; මිඹිදුවන්, මධුබින්දුසමානයි; සේකර, වක්‍රහෙම, දැමූ, නික්ෂේපකලාවූ; රිදීවිත්වන්, රජතනාච්චිකාවක්සමානයි.

53 තොස් පත් කුසල් දම්වඩමින් දනෝසියල්
සිත්සේ පුද ලෝ හිමිදම් සඟුන් යලිත්
තුස්නාදනන්ගේ දුටු සිත් නුවන් බොහෝ
දෙව්ලෝපවා නැත් ගිනිමල් පුදක්කළෝ

53 කුසල්දම්වඩමින්, කුසලධර්මවර්ධනයකොට; තොස්පත්, තුෂ්ටිප්‍රාප්තවූ; සියල්දනෝ, සකලජනයෝ; යලිත්, නැවතත්; ලෝහිමි, සර්වඥයන්; දම්, ධර්මයද; සඟුන්, සඞ්ඝයාද; යන මේරත්නත්‍රයට; සිත්සේ, සිත්වූපරිද්දෙන්; පුද, පූජාකොට; දුටු, දර්ශනයකළාවූ; බොහෝ, බහුලවූ; දනන්ගේ, ජනයන්ගේ; සිත්නුවන්, චිත්තනේත්‍රයන්; තුස්නා, සතුටුකරන්නාවූ; දෙව්ලෝපවානැත්, දිව්‍යලෝකයෙහිපවානැත්තාවූ; ගිනිමල්පුදක්, ගිනිමල්පූජාවක්; කළෝ, කළාහුය.

54 මේ පින් බිමේ සියළු පව් නිරිඳුන් වනාස් වස්
දක්නා සුලෙව් අරදහස් වෙඩියෙන් වියත්පත්
බූදෙස් නැමී තුරු නමින් ගිනිමල්බලා හෙත්
දිව් යය් සුරන් පුදට එව් දුටුවන් වැඩූතොස්

54 මේ පින්බිමේ, මේ පුණ්‍යභූමියෙහි; සියළුපව්නිරිඳුන්, සකලපාපනමැතිනරේන්ද්‍රයන්ගේ; වනස්වස්, විනාශයපිණිස; දක්නා, දර්ශනයවන්නාවූ; නොහොත් සවන්නාවූ; සුල්එව්, ඊගස්වැනිවූ; අරද, වාරයෙන්වාරය; වියත්පත්, ආකාශයටප්‍රාප්තවූ; අහස්වෙඩියෙන්, ආකාශවෙඩිලිවලින්; බූදෙස්නැමී, භූමියදිශාවටනැමී; තුරුනමින්, තාරකානාමයෙන්; යුක්තවූ; ගිනිමල්, අග්නිපුෂ්පයන්; හෙත්, වැටෙනකල්හී; බලා, නිරීක්ෂණයකොට; සුරන්, දෙවියන්විසින්; පුදටඑව්, පූජාපිණිසඑව්වාවූ; දිව්යය්, ප්‍රදීපයයිසිතා; දුටුවන්, දර්ශනයකළාවූජනයෝ; තොස්වැඩූ, සන්තෝෂවර්ධනයකළාහුය.

55 දෙව්ලෝ පවා කළ නොහැ කි වියතුන් නොහැකි හැකි
මේ පින් කමේ වෙසෙස සක් රජුටත් කියාලා
සිත් තොස් කළොත් සෙහෙක සත් දනයන් සැදූ පුන්
දූමෙන් යැවූ වෙඩිලි ගස් නුබපත් ගනන් නැත්

55 දෙව්ලෝපවා, දිව්‍යලෝකයෙහිපවා; කළනොහැක්, කරන්ටනො හැකිවූ; වියතුන්, ව්‍යක්තයන්විසින්; නොහිහැක්, කියනොහැක්කාවූ; මේපින්කමේ, මේපුණ්‍යකර්මයෙහි; වෙසෙස, විශේෂය; සක්රජුටත්, ශක්‍රරාජයාටත්; කියාලා, කථනයකොටලා; සිත්තොස්කළොත්, චිත්තසන්තෝෂකළහොත්; සෙහෙක, සහපතෙක; සැදූපුන්, සධාවෙන්පුක්තවූ; සත්දනයන්, සත්පුරුෂජනයන්විසින්; දූමෙන්යැවී, දූතයන්මෙන්යැව්වාවූ; නුබපත්වෙඩිලිගස්, නභප්‍රාප්තවෙඩිලිගස්; ගනන්නැත්, සංඛ්‍යාවක්නැත්තේය.

56 සතොස් කරම්හය් සුදනන් කමල් සියල්
සැපත් සහස් රැස් බිඹුමෙන් දහස් ගනන්
නමින් ගුවන් සක් වෙඩිපත් වෙලා අහස්
සිරින් පියුම්රා මිණි සක් බිපු නුබෙබි

56 සියල්සුදනන්කමල්, සකලසජ්ජනමුඛපද්මයන්; සතොස්කරම්හය්, සන්තෝෂකරම්හස්කියා; සැපත්, සම්ප්‍රාප්තවූ; දහස්ගනන්, සහශ්‍රගනන්; සහස්රැස්බිඹුමෙන්, සූර්‍ය්‍යබිම්බයන්මෙන්; ගුවන්සක්නමින්, ආකාශචක්‍රයන්නමින්; වෙඩි, වෙඩිලි; අහස්පත්වෙලා, ආකාශයටපැමිණිලා; පියුම්රාමිණිසක්සිරින්, පද්මරාගමාණික්‍යචක්‍රශොභාවෙන්; නුබෙබිඳ්, ආකාශයෙහිවිජෘම්භනය කළාහුය.

57 කුසුම් නිලාවක් ඔසවා යමෙක් පුදත්
වටින් නිකුත් නිල් කැළුමේ වැගි කුසුම්
සුනිල් පැසෙක්හි දිලිනා කුසුම් දමක්
බැහු සිරින් ඒ සබයේ ගොබාදිලි

57 කුසුම්නිලාවක්, මල්නිලාවක්; ඔසවා, උස්කර; යමෙක්පුදත්, කෙනෙක් පූජාකරණකල්හි; වටින්නිකුත්, හාත්පසින්නිස්ක්‍රාන්තවූ; නිල්කැළුමේ, නීලකාන්තියෙහි; කුසුම්වැනි, මල්වැනි; සුනිල්පැසෙක්හි, අතිනීලමණිපැසෙක්හි; දිලි, දිලියෙන්නාවූ; නාකුසුම්දමක්, නාගපුෂ්පදමයක්; බැහුසිරින්, බහණලද්දාවූශ්‍රියාවෙන්; ඒසබයේ, ඒ සබාවෙහි; ගොබාදිලි, ශෝභනකොට දිලිහුනි.

58
සපිරිසිත් දහමින් සතන් මොහඳුරන් සිත් නෙන් පිටත්වූ ලෙසින්
පලවී නිල් පැහැ ඒ සබඩ අඑනිලාවන්ගේ සුනිල් රැස් කඳින්
එහෙයින් මෙන් බැතියෝ එදා නම්සාලෝ රූලෝතුමානන් පුදා
ඇදුරෝගත් ඉඳුනිල් මිණැය් පලිහුමේ කල්යය් පිළැස්ගත් රැඳුම්

58 සතන්, සත්වයන්ගේ; සිත්සපිරි, සිත්හිසම්පූර්ණවූ; දහමින්, ධර්ම
සන්තර්ණකොටගෙණ; මොහඳුරන්, මොහාන්ධකාරයන්; සිත්ගෙන්,
චිත්තයෙන්; පිටත්වූලෙසින්, පිටත්වූවාක්මෙන්; අළුනිලාවන්ගේ, අළිය
නිලාවන්ගේ; නිල්පැහැ, නීලවර්ණය; ඒ සබේ, ඒ සභාවෙහි; පළවී,
ප්‍රකාශවිය; එහෙයින්මෙන්, ඒ හේතුවෙන්මෙන්; සුනිල්රැස්කදින්, අති
නිලවර්ණරශ්මි සමූහයෙන්යුක්තවූ; ලෝතුමානන්ට, ලෝකෝත්තම
යානන්වහන්සේගේ රූපයට; බැතියෝ, භක්තිවන්තයෝ; එද, එදිනයෙ
හි; පුද, පූජාකොට; නමකළෝ, නමස්කාරකළාහුය; ඇඳුරෝ, ඇචා
ර්යයෝ; ඉඳුනිල්මිණැය්, ඉන්ද්‍රනීලමාණික්‍යයයක්කියා; පලිඟු, පළිඟුගල්; ග
ත්, ගත්තු; මේකල්හි, මේඝකාලයෙහිතා; පිලැස්, මයුරයන්; රැඟුම්ග
ත්, නෘත්‍යග්‍රහණය කළෝ.

59

යෙහෙකැය් මේ මැනිඳුන් බලා ගහ සරින් දන්නේ සිරින් දිත් ගුරු
සෙමෙරත් ගත් පිදුමෙන් නමාමුනිසඳුන් රක්නැය්සිතැය්සක්පනා
පිදුමෙන් ගත් සෙමෙරත් නමා මොහුටෙකල් හිමිසබේනන්සිරින්
සෙමෙරැය්නම්ලකුණෙන් ලකල් වෙඩිරැසක්දැක්වූ එයින් සිත්රැඳී

59 මෙම්මැනිඳුන්, මේමන්ත්‍රීන්ද්‍රයා; ගහසරින්, ග්‍රහයන්ගෙ සඤ්චාරයෙ
න්; බලා, නිරීක්ෂණයකොට; සිරින්, ශ්‍රියාවෙන්; දිත්ගුරු, අසුරගුරුනො
හොත්සිකුරු; සෙමෙරත්ගත්, චාමරයක්අතින්ගත්තේයයි; දන්නේ, වි
ජානනයකරන්නේය; යෙහෙකැය්, ඒ යහපත්වෙය්; මුනිසඳුන්, බුධශාස
නය; නමාපිදුමෙන්, භක්තියපූජාවෙන්; සක්පනා, චක්‍රපාණිනොහොත්වි
ෂ්ණු; රක්නැය්සිතැය්, රක්ෂාකෙරෙද්සිතන්නේය; නමා, ඒවිෂ්ණුවිසින්;
ගත්, ග්‍රහනයකළාවූ; සෙමෙරත්, චාමරයත්; මොහුට, මේමන්ත්‍රීශ්වරයා
හට; පිදුමෙන්, පූජාකළාක්මෙන්; එකල්හි, ඒකාලයෙහි; සෙමෙරැය්න
ම්, චාමරයයිනම්වූ; ලකුණෙන්, ලක්ෂණයෙන්; ලකල්, අලඞ්කෘතවූ; වෙ
ඩිරැසක්, වෙඩිරශ්මියක්; මේසබේ, මේසභාවෙහි; නන්සිරින්, නානාප්‍රකා
රශ්‍රියාවෙන්; දැක්වූ, දර්ශනයකරවූහ; එයින්, ඒ කාරණකොටගෙණ; සි
ත්රැඳි, සිත ඇළුනේය.

60 උවිඳුර කැළුමෙන් නිල් වෙන්කලාගේ ගෙලේ ඇ
පවල හරිනුදුල්සිත් කල් තෙනෙව් ලෙව් නුවන් ගත්
පවල පුළුපු මල් දුල් නිල් මිණෙන්වූ කලස් මෙන්
වෙඩිලි බැඳි දෙඩන් දැක්වූ නොයෙක් නන්හි නන්ගී

60 උවිඳු, උපේන්ද්‍රයාගේ; උරකැළුමෙන්, උරස්ථලයෙහිකාන්තියෙන්;
නිල්, නීලවර්ණවූ; වෙන්කලාගේ, ශ්‍රීකාන්තාවගේ; ගෙලේඇ, ග්‍රීවයෙ
හි බැඳුවාවූ; පවලහරින්, ප්‍රවාලහරයෙන්; උදුල්, උජ්වලිතවන්නාවූ; සි

ත්කාල්, විත්තකාන්තාවූ; තෙනෙව්, පයෝධරයමෙන්; ලෙව්, ලෝකයාගේ; නුවන්ගත්, නේත්‍රාකර්ෂණයකළාවූ; පවළපුළුපුමල්, ප්‍රවාලමයනාලිකේරපුෂ්පයන්ගෙන්; දුල්, උජ්වලිතවූ; නිල්මිණෙන්වූ, නීලමාණික්‍යයෙන්කරණලද්දාවූ; කලස්මෙන්, ඝටයන්පරිද්දෙන්; වෙඩිලිබැඳි දෙබත්, අග් නිපුණපබන්ධනයකළාවූ; ජම්බීරඵලයන්, නොයෙක්තන්හිතන්හි, අනේකස්ථානයන්හි; දැක්වූ, දර්ශනයකරවූහ.

61 මෙහි අසුරබිඹියෙක් ඇත්නම් මුදම් මැය්සි තාලා
සකාවිගෙණ බැමුවාමෙන් තෙවික්මෙන්තෙවික්මා
අපමුනිඳුතුමාගේමෙන්පවත්නා දහම් සක්
එදවසෙහි බැමුවාකල් කුසුම්සක් ගනන් නැත්

61 මෙහි, මෙතැන්හි; අසුරබිඹියෙක්ඇත්නම්, දානවභිතියෙක්ඇත්තේවීනම්; මුදම්මැයිසිතලා, මොචනයකරම්මැය්චින්තනයකොට, තෙවික්මෙන්, ත්‍රිවික්‍රමයෙන්යුක්තවූ; තෙවික්මා, විශ්ණුහුවිසින්; සකවිගෙණ, චක්‍රායුධයහැරගෙණ; බැමූවාමෙන්, භ්‍රමනයකෙරෙව්වාක්මෙන්; අපමුනිඳුතුමාගේ, අපගේමුනීන්ද්‍රෝත්තමයාගේ; පවත්නා, ප්‍රවෘත්තිතවනාවූ; දහම්සක්මෙන්, ධර්මචක්‍රයමෙන්; එදවසෙහි, එදිනයෙහි; බැමුවා, භ්‍රමණයකෙරෙව්; කල්, මනෝඥවූ; කුසුම්සක්, මල්චක්‍ර; ගනන්නැත්, සංඛ්‍යාවන්නැත්තේයි.

62 දෙව්ලෝ පවානැතිනුවන් බඳනා නොයෙක් කම්
දැක්නාසිහින් එහිසැපත් තිදසින් නොවිලස්
දෙව්කත්සුරන්රිසසකින් සැදුනෙවිසබෙමි
දැක්වූනොයෙක් වෙඩිරුසක් කාවිසක්නමින්යුත්

62 දෙව්ලෝපවානැති, දිව්‍යලෝකයෙහි පවානැත්තාවූ; නුවන්බඳනා, නේත්‍රබන්ධනය කරන්නාවූ; නොයෙක්කම්, නොයෙක් කර්මාන්තයන්; දක්නාසිහින්, දක්නාවිභූතයෙන්; තිදසින්, ත්‍රිදසපුරයෙන්; නොවිලස්, අලසනොව; එහිසැපත්, එතැන්හි පැමිණියවූ; දෙව්කත්, දිව්‍යකාන්තාවන්; සුරන්, දේවතාවන්; රිසසකින්, රුචිචක්‍රයෙන්; සැදුනුවූ, සර්ජිතවූවාක්මෙන්; මෙයබෙ, මේසභාවෙහි; කාවිසක්නමින්යුත්, කාව්‍යචක්‍රනාමයෙන් යුක්තවූ; නොයෙක් වෙඩිරුසක්, අනේක වෙඩිලිසමූහයක්; දැක්වූ, පෙන්වූ.

63 සබකත් වෙණුරුක් කඩරන් මදෙසින්
ගෙණ රත්මිණිරන් සුනු එක්කරමින්
විසුලෙව් සපුමල් කුඹුනම්වෙඩියෙන්
මනකල් ගෙමවන් පැගැවී එසබෙ

63 සබඳකස්, සහානමැති කානනාට; වෙඩූරැක්කඩ, මඤ්ඤනාකාණ්ඩය
ක්; ගෙණ, ගුහනයකොට; රන්මදෙයින්, සවර්ණ මන්ජුෂාවෙන්; රත්
මිණි, ලෝහිතාංකමාණික්‍යද; රන්සුනු, සවර්ණචූර්ණද; එක්සරමින්,
එකතුකොට; ඒසබේ, ඒසභාවෙ; විසුලෙව්, විසිරෙව්වාක්මෙන්; සපුමල්
කුඹුනම් වෙඩියෙන්, චම්පකපුෂ්පකුම්බනම් වෙඩිල්ලෙන්; මනකල්, චි
ත්තකාන්තවූ; හෙමවන්පැහැවී, සවර්ණවර්ණප්‍රභාවවූයේයි.

64 සහස් නෙතා දෙව්සබමෙන්නිතින් දිළු
දහස් කැළුම් රැස්වෙඩියෙන්හෙබුසබේ
සහස් රැසා රැස්කලඹින් හෙබුනිමල්
අහස් කුසෙව් සිත්පිණවා නිතින්දිලි

64 සහස්නෙතා, සහශ්‍රනේත්‍රයාගේ; දෙව්සබමෙන්, දිව්‍යසභාවමෙ
න්; නිතින්, නිරන්තරයෙන්; දිළු, දිප්තිමත්වූ; දහස්කැළුම්රැස්වෙඩියෙ
න්, සූර්‍ය්‍යාලෝකය යන වෙඩිල්ලෙන්; සබේ, සභාව; හෙබු, හෙබවීය; ස
හස්රැසා, සූර්‍ය්‍යාගේ; නිමල්, නිර්මලවූ; රැස්කලඹින්, රශ්මිකදම්බයෙන්;
හෙබු, හෙබියාවූ; අහස්කුසෙව්, ආකාශකුක්ෂියමෙන්; සිත්පිණවා, චිත්
තපිණනයකරවා; නිතින්, නිරන්තරයෙන්; දිලි, බ්‍රාජිතවී.

65
මීසක් මී සලමෙ ගැජුම් සිඳුගැජුම් කාව් සක් සිහින් මල්නිලා
ගිම් රැස්රැස් සඳරැස් නැකැත් කුඹු සමන් මල්සක්වියත් සක්නිමල්
මේඇතන් සුවහස් ගනන් වෙබි වෙසෙස් දැක්වූ එදා ඒ සබේ
සිව්වත්නත්පොහොසත් කියන්නටනොවෙත්ඉන්මම්කියම්දෝ කෙසේ

65 මිසක්, භූමිචක්‍රය; මීසල, භූමිකම්පාවය; මෙගැජුම්, මේඝගර්ජිතා
වය; සිඳුගැජුම්, සමුද්‍රඝෝෂාවය; කාව්සක්, කාව්‍යචක්‍රය; සිහින්මල්නිලා,
සීත්මල්නිලාය; ගිම්රැස්රැස්, සූර්‍ය්‍යාලෝකය; සඳරැස්, චන්ද්‍රාලෝකය; නැ
කැත්කුඹු, තාරකාකුම්භය; සමන් මල්සක්, සුමනමාලචක්‍රය; වියත්ස
ක්, ආකාශචක්‍රය; සක, නිමල්, නිර්මලවූ; මේඇ, මේආදිවූ; නන්සුවහස්ග
නන්, නොයෙක්ලක්ෂනනන්; වෙබිවෙසෙස්, වෙඩිලිවිශේෂයන්; ඒදා,
එදවස්හි; ඒසබේ, එසභාවෙහි; දැක්වූ, දර්ශනයකෙරෙව්වාහුය; සිව්වත්,
මහාබ්‍රහ්මයාද; නත්, අනන්තනාම් නාගරාජයාද; කියන්නට, කථනය කෙ
රන්නට; පොහොසත් නොවෙත්, සමර්ථනොවෙත්ය; ඉන්, එසේහෙයි
න්; කෙසේ, කවර; පරිද්දෙකින්, මම්කියම්දෝ; මමකථනයකෙරෙම්දැ

66 මුවන පය දෑවව් මල් පැස් ගනිව් ගොස් කඩව් මල්
හමදුව මත නෙව් සිල්වත් දනන් වෙය් උදා කල්
මෙවෙඩි පුද හැරෙය් දුක්වි හඬන්නෙව් ජ.සාක ල්
පැවති තඹ සිළින් රැව් ඒ තෙයම් රැ ඉකුත් වී

66 මුව අත පය, මුඛ හස්ත පාදයන්; දෙවමි, ධෝවනයකරවමි; මල් පැස්ගනිමි, පුෂ්පපිටකයන් හැරගනිමිව; හමදුව, සම්මර්ජනයකරවමි; උදකල්වෙයි, උදයකාලයවන්නේය; සිල්වත්දනන්, ශීලවන්ත ජනයන්ට; අමතනෙමි, ආමන්ත්‍රනයකරන්නාක්මෙන්; මෙවෙඩිපුද හැරෙයි, මේ වෙඩිලිපූජාඅත්හැරෙයි; දුක්වී, දුක්ව; නිසාකල්, රාත්‍රිනමැති කාන්තාව; හඩනෙවි, හඩන්නාක්මෙන්; තඹසිළුන්රැවි, කුකුලන්ගෙරාවය; පැවති, ප්‍රවෘත්තිතවූ; ඒ තෙයම්රැ, ඒ තුන්යම් රාත්‍රිය; ඉකුත්වී, අතික්‍රාන්තවීය.

67 පැහැනදළු නිලාවෙන් පත්කැළුම්හි සුදිස්නා
දිනිදලු මඹලෙන් පත් රත් කැළුම්මෙන් එතැන්හි
උරමඩල වැසූ රන්වත්වතින් මෙන් තෙවික්මා
පැමිණරුණු කැළුම් නිල්වන් අහස් කුස් නිමල්වී

67 පැහැනද, ප්‍රභාවෙන්නන්දනවූ; අළුනිලාවෙන්පත්, එළියනිලාවෙන්පැමිණියාවූ; කැළුම්හි, කාන්තියෙහි; සුදිස්නා, සහපත්වදෘශ්‍යමානවන්නාවූ; දිනිඳු, සූර්‍ය්‍යාගෙ; අළුමඩලෙන්, රශ්මිමඩලයෙන්; පත්, පැමිණියාවූ; රත්කැළුම්මෙන්, රක්තකාන්තියමෙන්; එතැන්හී, ඒ ස්ථානයෙහි; රන්වත්වතින්, රත්රන්වර්ණවස්ත්‍රයෙන්; උරමඩල, වක්‍ෂමණ්ඩලය; වැසූ, ඡාදනයකළාවූ; තෙවික්මාමෙන්, ත්‍රිවික්‍රමයාමෙන්; අරුණුකැළුම් පැමිණ, අරුණවර්ණකාන්තියප්‍රාප්තව; නිල්වන්, නීලවර්ණවූ; අහස්කුස්, ආකාශකුක්‍ෂිය; නිමල්වී, නිර්මලවූයේය.

68 මෙකල පුද සිරිත් තොස් සත් දනන් වත් පියුම්මෙන්
පුබුදුකර පියුම්විල් සවි සහස් රැස් එකල්හි
උදයගිරිසිඝින් පත්වී බිජීඉන් වියත්හී
මෙපුදකර වසන්පත්වී පිදුම් වස් පහන්හී

68 මෙකළ, මේකරණලද්දාවූ; පුදසිරිත්, පූජාචාරිත්‍රයෙන්; තොස්, සන්තුෂ්ටවූ; සත්දනන්, සජ්ජනයන්ගේ; වත්පියුම්මෙන්, මුඛපද්මයන්ගෙ ආකාරයෙන්; සව්පියුම්විල්, සියළුපද්මතටාකයන්; එකල්හී, ඒ කාලයෙහි; සහස්රැස්, සූර්‍ය්‍යතෙම; පුබුදුකර, ප්‍රබුද්ධකොට; උදයගිරිසිඝින්, උදයපර්වතමස්තකයෙන්; පත්වී, සම්ප්‍රාප්තව; පහන්හී, උදයකාලයෙහි; පිදුන්වස්, පූජාපිණ්ඩයමෙන්; වියත්හී, ආකාශයෙහි; බිජී, භ්‍රාජිතවිය; ඉනී, එහෙයින්; මෙපුදකර, මේ පූජාකොට; අවසන්පත්වී, අවසාන ප්‍රාප්තවිය.

69 දසදිනෙක දවස් රැ ඒ ගමෙහි මේ පුදෙන්සවි
සුතුරු විසිදෙනක්නෙන් රැ බණක් දෙස්වවන්හී
මහ සඟන පුද දන්දි කෙළේ පින්කමක් දුන්
එහිවිතර මදක් දක්වමි අසව් ඒ නමා කන්

69 දසදිනෙක, දසදවසෙක්හි; දවස්රැ, දිවාරාත්‍රියෙහි; ඒ ගඟේ, ඒ ගඞ්ගාවෙහි; මේ සව් පුදෙන්, මේ සකලපූජාවන්ගෙන්යුක්තාව; සුතුරු විසිදෙකක්නෙන්, සූත්‍රවිසිදෙහෙකින්; රැ බණක්, රාත්‍රිබණක්; දෙස්වමන්නි, දේශනාකරවමින්; මහසඟනපුද, මහසඞ්ඝයාට පූජාකොට; දන් දී, දානප්‍රදානයකොට; පින්කමක්කෙළේ, පුණ්‍යකර්මයක්කෙළේය; දැන්, මෙකල්හි; එහිවිහර, එහිවිසතරය; මදක්, ස්වල්පයක්; දක්වමි, පෙන්වමි; කණ්නමා, කණ්ණිනම්නාකොට; ඒ අසව්, ඒ ශ්‍රවණයකරව්.

70 හිමකොඳ සඳරැස් තුල්දැදිමුත් කිත් කැළුම්හී
සිළු දුල පහනන් ඒ පින්සබේ ලෙව් නුවන් ගත්
තුරුපෙල විලසින් සේ කැන් කැළුම් පත් වියත්හී
කිරණව පවලෙව් සිත් තොස්වැඩූ ර්පතුන්ගේ

70 හිම, පිනිය; කොඳ, කුන්දය; සඳරැස්, චන්ද්‍රරශ්මිය; තුල්, සමාන වූ; කිත්, කීර්තියෙන්; දිමුත්, දීප්තිමත්වන්නාවූ; දැ, ධාතූන්ගේ; කැළුම්හී, කාන්තියෙන්යුක්තාවූ; ඒ පින්සබේ, ඒ පුණ්‍යසභාවෙහි; ලෙව්නුවන්ගත්, ලෝකයාගේනෙත් පැහැරගන්නාවූ; සිළුදුල, සිඛාවෙන් බබලන්නාවූ; පහනන්, ප්‍රදීපයන්; සේකැන්කැළුම්, චන්ද්‍රකාන්තිසමූහය; පත්, පැමිණියාවූ; වියත්හි, ආකාශයෙහි; තුරුපෙලවිලසින්, තාරකාපඞ්ක්තියමෙන්; කිරණව, ක්ෂීරාර්ණවයෙහි; පවලෙව්, ප්‍රවාලයන්මෙන්; ර්පතුන්ගේ, එහිප්‍රපතාවූවන්ගේ; සිත්තොස්වැඩූ, චිත්තසන්තෝෂවර්ධනය කළාහුයි.

71 ඒ ගංතෙරේ දිලි පහන් සිළුවන් ගඟේසේ
ආ නාපුරෙන් පුදැඹුරන් දද කැන් බලාලා
ගන්නාසපුන් ගුරුළුයැයි සිතමින් බියෙන් උන්
ලාදිව්සිරින් කටමැණික් පලවී එතැන්හී

71 ඒගංතෙරේ, ඒ ගඞ්ගාතීරයෙහි; දිලි, දීප්තිමත්වූ; පහන්සිළු, ප්‍රදීපසිඛාවෙන්; ගඟේවන්, ගඟටප්‍රතිබිම්බවූ; සේ, ඡායාවෝකෙසේද; නාපුරෙන්, නාගපුරයෙන්; පුදට, පූජාපිණිස; ආ, ආගමනයකළාවූ; උරගන්, සර්පයන්; දදකැන්, ධ්වජසමූහයා; බලාලා, නිරීක්ෂණයකොට; සපුන්ගන්නා, සර්පයන්ග්‍රහණයකරන්නාවූ; ගුරුළුයයි, ගරුඩයෝයයි; සිතමින්, චින්තනයකරමින්; බියෙන්, භීතියෙන්; උන්, ඒ සර්පයන් විසින්; එතැන්හී, ඒ ඒ ස්ථානයෙහි; ලාදිව්, හෙළාදිව්වාවූ; කටමැණික්සිරින්, කණ්ඨමාණික්‍යශෝභාවෙන්; පළවී, ප්‍රකාශවිය,

72 සටග සටග සෑදු නන්දදන් කැන්
කිකිණි රැවින් අමතා සුරන් අහස් ගොස්
තොප මතට වඩා සියක් ගුණෙන්යුත්
දහමමගන්ට එවයිකි යන්නවුන්වන්

72 සටගසටග, සත්‍යාග්‍රයක් සත්‍යාග්‍රයක්පාසා; සැදු, සර්ජිතකළාවූ; නන්දදන්කැන්, නොයෙක්ධ්වජසමූහයන්; කිකිණිරැවින්, කිංකිණිකනාදයන්කරණකොටගෙණ; අහස්, ආකාශයට; ගොස්, ගමනයකොට; සුරන්, දේවතාවන්ට; අමතා, ආමන්ත්‍රනයකොට; තොපමිතටවඩා, තොපගේඅමෘතයට අධිකකොට; සියක්ගුණෙන්යුත්, සියයක්ගුණයෙන්යුක්තවූ; දහම්අමා, ධර්මාමෘතය; ගන්ටඑවයි, ගැණීමපිණිසඑන්වයි; කියා, කථනයකොට; කියන්නවුන්වන්, කථනයකරන්නවුන්වැන්නෝය.

73 සුනිමල් අදබන්සට වෙන් පදපත්
උරගුන් ගනිමින් ගුරුළැය් නරඹා
පිලිසන් වබියෙන් සැලෙනා දියෙහි
සියුරන් විලසින් බිඹුසේ පළවී

73 සට, සත්වියෙනි; බන්, බදිනලද්දවූ; සුනිමල්, අතිශයින්නිර්මලවූ; දද, ධ්වජයන්; උරඟුන්ගණිමින්, සර්පයන්ග්‍රහණයකරමින්; වෙන්පදපත්, ආකාසයටපැමිණියාවූ; ගුරුළැයි, ගරුඩයෝයයි, නරඹා, බලා; දියෙහි, ජලයෙහි; පිලිසන්ව, නිලීනව; බියෙන්, භීතියෙන්; සැලෙනා, කම්පාවන්නාවූ; සියුරන්විලසින්, නාගයන්සියගනන්මෙන්; බිඹුසේ, ප්‍රතිබිම්බාකාරය; පළවී, ප්‍රකාශවූයේයි.

74 දෙනසග සුවමොක් දසේකරගේ කැනින්දුල්
මුනිබණ සූනෙරින් යුත් දිවිඇගැසත්කුලන් සෙවි
සබගිරිසයුරේ දුවිරලෙව් බුන් නුවන් ගත්
සුසැදිහෙළ වැරැල්ලෙන් පුන් සමන්මල් දමින්සන්

74 සගසුව, ස්වර්ගසුඛයහා; මොක්දෙන, මෝක්ෂදානයකරන්නාවූ; දසේකරගේ, ධාතුනමැතිමහදුයාගේ; කැනින්දුල්, කාන්තියෙන්උජ්වලිතවූ; දිවිඇගෑ, ප්‍රදීපඅර්ඝිකානමැති; සත්කුලන්, සප්තකුලපර්වතයන් විසින්; සෙවි, සේවනයකරණලද්දවූ; මුණිබණ, බුධධර්මනමැති; සුනෙරින්යුත්, සුමේරුපර්වතයෙන්යුක්තවූ; සබගිරිසයුරේ, සභානමැතික්ෂීරසාගරයෙහි; දුවී, ජාතවූ; බුන්රැලෙව්, බිඳුනාවූතරඞ්ගවැනිවූ; හෙළවැරැල්ලෙන්, සෙවතබම්බාරයෙන්ද; පුන්සමන්මල්දමින්, සුපුෂ්පිතසුමනපුෂ්පදමයෙන්ද; සුසැදි, සුසර්ජිතවූ; සන්, ජන්‍යයෝ; නුවන්ගත්, ජනයන්ගේනේත්‍රග්‍රහණයකළෝ,

75 සිරිඳු තුරුනා සහඳො පෙලදුල්
තුරු රැව් ගොසදිවි කිරණින් මනකල්
සබවෙන් පදසේවෙලවන් පැහැපත්
හෙලඹුල් දලවන් වියනින් සුසැදි

75 සිරි, ශ්‍රීමත්වූ; ඳ, ඩාතුනමැති; තුරුනා, චන්‍ද්‍රයාගෙණ්; සහ, සඩ්‍යනමැති; ඳෝපෙල, තාරකාපඞ්ක්තියෙණ්; උදුල්, උජ්වලිතවූ; තුරුරැව්, තූර්‍ය්‍යනිරාවනමැති; ගොස, ඝෝසාවෙන්; දිවිකිරණින්, ප්‍රදීපාලෝකනමැතිරශ්මියෙණ්; මනකල්, මනෝඥවූ; සබ, සභානමැති; වෙන්පද, ආකාශයෙහි; සේවෙලවන්, ශ්වේතාභ්‍රයන්වැනිවූ; පැහැපත්, ප්‍රභාප්‍රාප්තවූ; හෙළඹුල්දලවන්, කුමුදුපත්‍රයන්වැනි; වියනින්, විතානයෙන්; සුසැදි, සුසජ්ජිතවී.

76 කොඩි බන් පෙලටැමි පවනින් සැලෙනා
එසි පත් සුරනා සුරුරන් බණසා
වැඩවෙය් බණිමින් උනුනුන් අමතා
සතුටින් සිතුහිස් සැළුමෙන් පලවී

76 කොඩිබන්, ධවජබඩවූ; පවනින්සැලෙනා, මාරුතයෙන් චචලචන්නාවූ; ටැම්පෙල, ස්ථම්භපඞ්ක්තියකෙසේද; එහි, ඒස්ථානයෙහි; පත්, පැමිණියාවූ; සුරනා, දේවේන්‍ද්‍රයන්; අසුර, අසුරයන්; උරන්, නාගයන්; බණඅසා, ධර්මශ්‍රවණයකොට; උනුනුන්අමතා, ඔවුනොවුන් ආමන්ත්‍රනය කොට; වැඩවෙයිබණිමින්, අභිවෘද්ධිවෙය්කියමින්; සිතුසතුටින්, චිත්තසන්තෝෂයෙන්; හිස්සැළුමෙන්, ශිෂ්වාලනයකළපරිද්දෙන්; පළවී, ප්‍රකාශවිය.

77

යගපත් සත් ගුණයුත් සියල් සුදනයන් මේ පින්කමින් දපිනින්
සුරඹුන් දෙව් රඟ පාන දක්නට නිමිත්තෙව් පානපත් විතිදස්
මුනිඳු ගුත්තිලඳු අවුත් සුරපුරෙන් දුක්වූ රැගුම් දෙව්සරන්
අඟවන්නන් විලසින් තැනින්තැන රැගුම් දක්වූ නාලන් ඒසබෙ.

77 යහපත්, සුන්දරවූ; සත්ගුණයුත්, ශාන්තගුණයෙන්යුක්තවූ; සියල් සුදනයන්, සකල සජ්ජනයන්; මෙපින්කමින්, මෙපුණ්‍යකර්මයෙන්; ද, ජාතවූ; පිනින්, කුසලයකරණකොටගෙණ; තිදස්පත්වී, දිව්‍යලෝකයටසම්ප්‍රාප්තව; සුරඹුන්පාන, දිව්‍යාඞ්ගනාවන්විසින්පෙන්වන්නාවූ; දෙව්රඟ, දිව්‍යනෘත්‍යය; දක්නට, දකිමපිණිස; පාන, ප්‍රකාශකරන්නාවූ; නිමිතෙව්, නිමිත්තක්මෙන්; මුනිද, මුනීන්‍ද්‍රයා; ගුත්තිලද, ගුත්තිලපණ්ඩිතවූකාලයෙහි; සුරපුරෙන්අවුත්, දිව්‍යලෝකයෙන්ආගමනයකොට; දෙව්සරන්, දිව්‍යාඞ්ගනාවන්විසින්; දක්වූ, දර්ශනකරවූ; රැඟුම්, නෘත්‍ය-

ෂ; අඟමන්නන් විලසින්, හඳුන්වන්නාවුන්පරිද්දෙන්; නලන්, නාවිකා වෝ; ඒසබේ, ඒසභාවෙහි; නැතින්නැන, නන්ගිතන්සි; රැඟුම්දක්වූ, නෘත්‍යදක්වූහ.

78 කිත් කත් රඟත් මේ මැතිඳුන් අසා දහම්
ගිව්ගී බැහුමුත් හරණිවැටි සිදී
සුන්වීගියෙව් පාවැද ඒ දහම් සබේ
වැල්ලෙන් සැදී සේකපුරෙන් දනන්පිදූ

87 මේ මැතිඳුන්, මේ මන්ත්‍රිකුයාගේ; කිත්කන්, කිර්තිනමැතිකාන්තාව; දහම්අසා, ධර්මශ්‍රවණයකොට; රඟත්, නටනකල්හී; ගිව්ගිබැනු, ග්‍රීවයෙහිබහණලද්දවූ; මුත්හර, මුක්තාහරය; ඉනිවැටි, මිදිවැටි; සිදී, ඡින්නාව; පාවැද, ජනයාගේපාදඝණ්ටනයවීමෙන්; සුන්වීගියෙව්, චූර්ණිවහියාක්මෙන්; ඒදහම්සබේ, ඒධර්මසභාව; සේවැල්ලෙන්, ශ්වෙතපුලිනයෙකු, දනන්පිදූ, ජනයන්විසින්පුදනලද්දවූ; කපුරෙන්, කර්පූරයෙකු; සැදී, සර්ජිතවිය,

79 දූ හෙම් කුලින් දම්සිලිලෙන් ලකල් නිමල්
දන්වත් රැලින් ඒ සබගැප් රුවන්කරේ
දූමෙන් ගිගුම් පස්තුරුරැව් කාලෝ එයින්
කාගේ සිතේ නූදසතොස් දුටන් කොරෙන්

79 නිමල්, නිර්මලවූ; දූ, ධාතුනමැති; හෙම්කුලින්, හේමකුටයෙකු; දම්සිලිලෙන්, ධර්මනමැතිසලිලයෙකු; ලකල්, අලංකෘතවූ; දන්වත්, දානවසත්‍රනමැති; රැලින්, තරඞ්ගයෙන්යුක්තවූ; ඒ සබගැප්, ඒ සභාගර්භනමැති; රුවන්කරේ, රත්නාකරයෙහි; දූ, ජනිතවූ; ගිගුම්මෙන්, ගර්ජිනාවමෙන්; පස්තුරුරැව්කලෝ, පඤ්චාඞ්ගිකතූර්‍යනාදපැවැත්තුයෝ; එයින්, එහෙයින්; දුටන්කොරෙන්, දර්ශනයකළාවුන්ගේ අතරෙන්; කාගේ, කවරෙකුගේ; සිතේ, චිත්තයෙහි; සතොස්නූද, සන්තෝෂනූපුද්දේද'

80 සියල් කෙලෙස් මුල් උදුරා වඩා කුසල්
නැනින් පසන් මේමැතිඳුන් බවෙන් මිදී
යෙහෙන් ලබයි සිව්පල දක්වනාක්හු මෙන්
සැදී පුළුප් කොස් පල තල් පුවක් මෙසිව්

80 සියල්, සියළුම; කෙලෙස්මුල්උදුරා, ක්ලේසමූලෝත්පාටනයකොට; කුසල්වඩා, කුසලධර්මයන්වර්ධනයකොට; නැනින්, ඥාණයෙන්; පසන්, ප්‍රශංසනීයවූ; මේමැතිඳුන්, මේමන්ත්‍රිතුයා; බවෙන්, භවයන්කොරෙන්; මිදී, මුක්තව; සිව්පල, සතරඵලය; යෙහෙන්ලබයි, සුවසේලබන්නේ

යයි; දක්වනක්නුමෙන්, දක්වන්නෙක්පරිද්දෙන්; ප්‍රළිප්, පොල්ද; කො
ස්පළු, කොස්ගෙඩිද; තල්, තල්ද; පුවක්, ක්‍රමුකාදයන; මේයිව්, මේස හ
රපිලවණ්ගයෙන්; සැදී, සර්ජනවිය.

81 බිදෙව් අමා සුරකැලන් බවදුක් නොනස්නා
මින්කම් නිමැය් සුරකලන් ගෙණවුත් එනැන්හී
සව්දම් අමා ගෙණ පුරා නොමදින් අහස්පත්
මෙන් නන් සිරින් කුඹුපෙලින් පළවී තොරන්හිස්

81 බවදුක්, සංසාරදුඃඛය නොනස්නා, නාශනොකරන්නාවූ; සුර
කැලන්, දිව්‍යසමූහයන්; දෙව්අමාබී, දිව්‍යාමෘතපානයකොට; මින්කම්නි
මැය්, මාණික්‍යකර්මයෙන්නිමිනවූ; සුරකලන්, දිව්‍යඝටයන්; ගෙණවුත්,
හැරගෙණඅවුත්; එනැන්හී, ඒස්ථානයෙහි; සව්දම්, සකලශ්‍රීසම්පන්න
වැනි; අමා, අමෘතය; නොමදින්, බොහෝසෙයින්; පුරාගෙණ, පූර්ණ
කොටගෙණ; අහස්පත්මෙන්, ආකාශයටප්‍රාප්තවූවාක්මෙන්; නන්සිරින්,
නොයෙක්ශොභාවෙන් යුක්තවූ; කුඹුපෙලින්, කුම්භපඞ්ක්තීන් කරණ
කොටගෙණ; තොරන්හිස්, තොරණ්මස්තකයන්; පළවී, ප්‍රකාශවිය.

82 නොපමන දැන සව්දහම් අමාබී
දැරියනොහිවම්නෙවීනැමී මුවෙන් යුත්
රඹතුරු මුවයින් රැගත් නෙළුම්මල්
සුරඋරඟුන් පළවී නිතින් පිදුන්වස්

82 පමන, ප්‍රමාණය; නොදැන, ජානනයනොකොට; සව්දහම්, සකල
ධර්මනමැති; අමාබී, අමෘතයපානයකොට; දැරියනොහී, ධාරණයකල
නොහැකිව; වමනැද්වී, වමනයකරණපරිද්දෙන්; නැමී, නමිනවූ; මුවෙ
න්යුත්, මුඛයෙන්නොහොත් මොවෙන්යුක්තවූ; රඹතුරු, රම්භාවෘක්ෂ
යෝ; පිදුන්වස්, පූජාපිණිස; මුවනින්, මුඛාග්‍රයෙන්; නෙළුම්මල්රැගත්, ප
ද්මයන්ග්‍රහණයකළාවූ; සුරඋරඟුන්, දිව්‍යනාගයෝමෙන්; නිතින්, නි
රන්තරයෙන්; පළවී, ප්‍රකාශවිය.

83 හිම කොඳ කිරිසක් දෙව්හි අමාකැන් අමාතුල්
පසිදු මෙමැහිඳුන්ගේ කිත් හරන් දික්කළඑන්ගේ
ගලපැලඳි කඩාඋන් දම්සෙබේ මේපිදුන් මෙන්
ගනාවලඳ සමන්මල් එක්ව ඉස්වා ලකාල්වී

83 දික්කළඑන්ගේ, දිශානමැති කාන්තාවන්ගේ; ගළපැලඳී, ග්‍රීවයෙහි
පිලන්ධනයකළාවූ; හිම, තුෂාරය; කොඳ, කුන්දය; කිරි, ක්ෂීරය; සක්, ශ
ඞ්ඛය; දෙව්හි, දිව්‍යගඞ්ගාවය; අමාකැන්, චන්ද්‍රයාය; අමා, අමෘතය; තු
ල්, සහමොවුන් සාදෘශ්‍යවූ; පසිඳු, ප්‍රසිද්ධවූ; මෙමැහිඳුන්ගේ, මේ මනින්ද්‍ර

ප්‍රියාගේ; කින්හරන්, කිඹිනිනමැති මුඛාභරණයන්; කඩා, ඛණ්ඩනය කොට; උන්, ඔවුන්විසින්; වෙදිමෙහෙබි, වේදිකාසභාවෙහි; පිදුන්මෙන්, පූජාකලාකාරයෙන්; ගනවදල, සාන්ද්‍රවියගත්වූ; ඉස්වා, ඉසිනලද; සමන්මල්ඊක්වී, සුමනපුෂ්පයන්ඒක්ව; ලකල්වී, මනෝඥවී.

84

සගමොක්දු මුනිඳු දහම් තෙදනැලෙන් පව් වස්අරන් දුගොසින්
නුබපත් දුම්සාඳ මෙන් නිතින් මුනිවදන් සෙවිනාසිතින් සිව්දිගින්
ඇවිදින් ඒ සබහස්ගැබේ සිටිසර මේ කුල්සිරින් එක්වෙලා
කළුවැල් දුම්සමගින් නොයෙක් සුවඳදුම් පත්වී අහස්කුස් හෙබී

84 සගමොක්දු, ස්වර්ගමෝක්ෂදායකවූ; මුනිඳු, මුනීන්ද්‍රයාගේ; දහම්තෙදනලෙන්, ධර්මනමැතිතේජොග්නියෙන්; පව්වස්අරන්, පාපනමැතිනුනවනය; දුගොසින්, දග්ධවගොසින්; නුබපත්, ආකාශප්‍රාප්තවූ; දුම්සඳමෙන්, ධූමස්කන්ධපරිද්දෙන්; නිතින්, නිරන්තරයෙන්; මුනිවදන්, සර්වඥවචනයන්; සෙවිනාසිතින්, සේවනයකරණචිත්තයෙන්; සව්දිගින්, සකලදිසාවෙන්; ඇවිත්, ආගමනයකොට; ඒ සබ, ඒ ධර්මසභානමැති; අහස්ගැබේ, ආකාශගර්භයෙහි; එක්වෙලාසිටි, එකතුවසිටියාවූ; සරාමේකුල්සිරින්, ශරත්මේඝකූටශොභාවෙන්; කළුවැල්දුම්සමගින්, කාලාගුරුධූමයහාසමග; නොයෙක්සුවඳදුම්, අනේකසුගන්ධධූමයෝ; අහස්කුස්, ආකාශකුක්ෂියට; පත්වී, ප්‍රාප්තව; හෙබී, ශොභාමානවී.

85 බබලනෙහි පහන් කැළුම් රුවන්රැස්
මැදෙහි නිතින් හොබනා නිමල් කුසුම් දම්
කෙලිනු තුරු රුවන්කරේ ගැලීලා
සුරඋරගුන් විලසින් දුටන් නුවන් ගත්

85 එහි, ඒධර්මසභාවෙහි; බබලන, භ්‍රාජිතවන්නාවූ; පහන්කැළුම්, ප්‍රදීපකාන්තීන්හා; රුවන්රැස්මැදෙහි, රත්නරශ්මීන්ගේ මධ්‍යයෙහි; නිතින්, නිරන්තරයෙන්; හොබනා, ශොභාමානවන්නාවූ; නිමල්, නිර්මලවූ; කුසුම්දම්, පුෂ්පදාමයෝකෙසේද; උතුරුරුවන්කරේ, උත්තරසාගරයෙහි; ගැලීලා, නිමග්නව; කෙලින, ක්‍රීඩාකරනනාවූ; සුරඋරගුන්විලසින්, දිව්‍යනාගයන්ගේවිලාසයෙන්; දුටන්, දර්ශනයකළවුන්ගේ; නුවන්ගත්, නේත්‍රාකර්ෂනයකළෝ.

86 මින් නිල් උපුල් රණ්හසරත් පියුම් යුත්
ගැලී නිතින් නාතිඳස් කැළුම් යුත්
මෙන් දෙව් ගඟේ පැන් තුලසිත් නමින්යුත්
සැදී එතැන්හි ඇතුරුම් පෙලින් දුල්

86 මින්, මත්‍ස්‍යයන්ද; නිල්උපුල්, නීලෝත්පලද; හස, හංසයන්ද; රත් පියුම්යුත්, රක්තපද්මයෙන්දයුක්තවූ; ගැලී, නිමග්නව; නිතින්, නිරන්තරයෙන්; නා, ස්නානයකරන්නාවූ; තිදස්, දෙවියන්ගේ; කැළුම්යුත්, කාන්තියෙන්යුක්තවූ; මින්, මේකාරණයෙන්; දෙව්ගඟේපැන්තුල, දිව්‍යගඞ්ගාවෙහිජලයැවැනිවූ; සිත්තම්න්යුත්, චිත්‍රකර්මයෙන්යුක්තවූ; ඇතුරුම් පෙලින්, ආස්තරණපඞ්ක්තියෙන්; සැදි, සර්ජිතවූ; එතැන්හි, ඒස්ථානයෙහි; දුල්, බැබලීමක්විය.

87 මේ පින්බෙලෙන් ලොවගබැව් පැමිණි මැතින්මේ
දෙන්නේ නිවන් සැපතෙයින් සිරිකල් උරේඋන්
පැමෙන් දසන් සිරිනිමල් සතුටින් සිනාසී
ඒ දම් සබේ ඔරැදිව් නාවපුල් පුවක් මල්

87 මේ මැතින්, මේ මන්ත්‍රීන්ද්‍රයා; මේ පින්බෙලෙන්, මේ පුණ්‍යබලකරණකොටගෙණ; ලොවගබැව්, ලෝකාග්‍රභාවයට; පැමිණී, ප්‍රාප්තව; නිවන්සැපත, නිර්වාණසම්පත්තිය; දෙන්නේ, දානයකරන්නේය; එයින්, එහෙයින්; උරේ, වක්‍ෂස්ථලයෙහි; සිරිකල්, ශ්‍රීකාන්තාව; සතුටින්, සන්තොෂයෙන්; සිනාසී, හාස්‍යකොට; නිමල්, නිර්මලවූ; දසන්සිරිපැමෙන්, දන්තශොභාව ප්‍රකාශකලාක්මෙන්; නව, අභිනවවූ; පුල්පුවක්මල්, ප්‍රබුද්ධක්‍රමුකපුෂ්පයෝ; ඒදම්සබේ, ඒධර්මසභාවෙහි; ඔරැදිවි, විරාජමානවිය.

88 දම් සෙව්නාවුන් එකඟසිත් කරණ ගැහුම්වස්
සොල්වා නාදින් ඔරදනා මිණිවන් පියුම්රා
යුත් රැව් බිඟුන් පුබුදඩක් තඹරන් අළුත් රත්
එල්ළු එයින් හැමතොරන් සදනාන් ලකල්වි

88 දම්සෙව්නාවුන්, ධර්මශ්‍රවණය කරන්නාවුන්ගෙ; සිත්එකඟකරණ, චිත්තය ඒකාග්‍රකරන්නාවූ; හැගුම්වස්, සංඥාවක්පිණිස; සොලවා, චාලනයකොට; නාදින්, නාදයෙන්; ඔරදනා, අවරඤ්ජනයකරන්නාවූ; පියුම්රාමිණිවන්, පද්මරාගමය ගන්ධාරවැනිවූ; බිඟුන්රැව්යුත්, භෘඞ්ගයන්ගෙරාවයෙන් යුක්තවූ; අඩක් පුබුදු, අර්ධයක් ප්‍රබුද්ධවූ; අළුත්රත්තඹරන්, අභිනවරක්තපද්මයන්; සදනාන්, සජ්ජනයන්විසින්; එල්ළු, ඕලම්භිත කරණලද්දාහුය; එයින්, ඒකරණකොටගෙණ; හැමතොරන්, සියළුමතොරණයෝ; ලකල්වි, අලඞ්කෘතවිය.

89 සන්සුන් සිතැත් සභරැලින් මුනි බස් දියෙන් යුත්
සව්සත් මසුන් රැඳිමුත් පුදවත් රුවන් යුත්
සිත්තල් දිමුත් එසබගැප් සිඳුනාන් සිරින් යුත්
මොන්දු තිලෝ ඇදුරුදු සුනෙරින් ලකල්වී

89 සත්ගුණ, සත්සිඳුනාවූ; සිත්අැත්, චිත්තයක්අැත්තාවූ; සනරැළින්, සඞ්ඛනමැති තරඞ්ගයෙන්ද; මුනිබස්දියෙන්, බුඩවචන නමැතිජලයෙන්ද; යුත්, යුක්තාවූ; සව්සත්, සකලසත්වනමැති; මසුන්රැඳි, මත්ස්‍යයන්රඤ්ජිතාවූ; දිමුත්, දිලියෙන්නාවූ; සුදමත්, පුණ්‍යවස්තුනමැති; රුවන්යුත්, රත්නයන්ගෙන් යුක්තාවූ; සිත්කල්, චිත්තකාන්තාවූ; දිමුත්, දීප්තිමත්වන්නාවූ; නන්සිරින්යුත්, නොයෙක්ශ්‍රියාවෙන් යුක්තාවූ; එසබනැප සිඳු, ඒ සභාගඞ්ගනමැති සමුද්‍රයතෙම; මොක්දූ, මෝක්ෂදායකවූ; තිලෝඅැඳුරු, ත්‍රෛලෝක්‍ය මාර්ගයගේ දෑසුනෙරින්, ධාතුනම්වූතිම්භමෙරින්; ලකළුව, අලඞ්කෘතවූයේයි.

90 අවා මගින් යානොමදී සියල් සතන්
නිවන් පුරේම සගමොක් සැපත් දෙමින්
බුදුන් මුවෙන් පත්අගසව් දූරුනිමල්
නිතින් හෙබි ඒ සබ්ගැප් දහම් කඳින්

90 සියල්සතන්, සකලසත්වයන්; අවාමගින්, අපායමාර්ගයෙන්; යානොමදී, යන්ටනොදී; සගමොක්සැපත්දෙමින්, ස්වර්ගමෝක්ෂසම්පත්දායකරමින්; නිවන්පුරේම, නිර්වාණපුරයෙහි දූවාවූ; බුදුන්මුවෙන්, බුදුන්ගේමුඛයෙන්; පත්, පැමිණියාවූ; නිමල්, නිර්මලවූ; අගසව්දූරු, අග්‍රශ්‍රාවකයන්විසින් දූරුවාවූ; දහම්කඳින්, ධර්මස්කන්ධයෙන්; ඒසබගැප්, ඒ සභාගඥය; නිතින්, නිරන්තරයෙන්; හෙබී, ශෝභාමානවූයේය.

91 ද මෙසසුන්විල්හි පියුම් පෙලක්වන්
කප්රුක් පෙලක්වන් බවදුක් මගේද
රක්නා නිමල් සිල් පිළිවෙත් නොනස්නා
ඒ දම්සබේ සිත් පිණවී සඟුන්ගෙන්

91 මෙ සසුන්විල්හී, මේ ශාසනනමැතිතටාකයෙහි; දූ, ජනිතවූ; පියුම් පෙලක්වන්, පද්මපඞ්ක්තියක්වැනිවූ; බවදුක්මගේ, බවදුඃඛනමැතිමාර්ගයෙහි; දූ, ජනිතවූ; කප්රුක්පෙලක්වන්, කල්පවෘක්ෂපඞ්ක්තියක්වැනිවූ; සිල්පිළිවෙත්, ශීලප්‍රතිපත්තීන්; නොනස්නා, විනාසනොකොට; නිමල්, නිර්මල්කොට; රක්නා, රක්‍ෂාකරන්නාවූ; සඟුන්ගෙන්, සඞ්ඝයාගෙන්; ඒදම්සබේ, ඒ ධර්මසභාව; සිත්පිණවී, චිත්තපිණනයකලේයි.

92 කණ්කණ් අමාවනාදහම් රසයුත් එතැන්හි
දිව්දිව්කැළුම් අරුණු රැස් සිරිපෑ පහන්හි
තුල්තුල් සියල් තුරුනාදීන් ගනාභුම් නොකල්හී
සිව්සිව් බසින් යුරනමා හැගවී සියල්ලන්

92 කණ්කණ්, ශ්‍රවණයන්ශ්‍රවණයන්පාසා; අමාවන, අභිෂනභාසමාන වූ; දහම්රසයුත්, ධර්මරසයෙන් යුක්තාවූ; එනැන්හි, ඒශ්‍ර්‍යස්ථානයෙහි; දිළි ඇ ව්, ප්‍රදීපයෙක් ප්‍රදීපයෙක්හි; කැළුම්, කාන්තීන්; පහන්හි, ප්‍රත්‍යූෂකාල යෙහි; අරුණුරැස්සිරිපෑ, අරුණරශ්මිශොභාවදක්විය; තුල්, මහත්වූ; සියල්තුරුනදින්, සකලතූර්‍යනිනාදයෙන්; ගොකල්හි, අකාලයෙහි; ගන ඝුම්තුල්, මේඝගර්ජනාසමානවිය; කිව්කිව්බසින්, කියන කියන ලදවචන යෙන්; සියල්ලන්, සියල්ලන්ටම; සුරන්අමාහැඟව්, දෙවියන්ගෙඅමෘතාස්‍ය හැඟවූයේය,

93 නිතින් පැවත්තූ පහනින් කැළුම් පත්
දනන් නුවන් ගත් සබගැප් සිලිල්නා
උදගිරින් පත් රිවිරැස් කදින් යුත්
ගුවන්තලේ මෙන් පිණවී දනන් සිත්

93 නිතින්, නිරන්තරයෙන්; පැවැත්තූ, ප්‍රවෘත්තිනකළාවූ; පහනින්, ප්‍රදීපයෙන්; පත්, පැමිණියාවූ; කැළුම්, කාන්තිකරණකොටගෙණ; ද නන්, ජනයන්ගෙ; නුවන්ගත්, නේත්‍රග්‍රහණයකළාවූ; සබගැප්, සභාග ර්‍භනමැති; සිලිල්නා, සමුද්‍රයතෙම; උදගිරින්, උදයපර්‍වතයෙන්; පත්, පැමිණියාවූ; රිවිරැස්කදින්යුත්, සූර්‍ය්‍යරශ්මිසමූහයෙන් යුක්තාවූ; ගුවන්ත ලේමෙන්, ගගනතලයපරිද්දෙන්; දනන්, ජනයන්ගේ; සිත්පිණවී, චි ත්තපිණනයකරවිය.

94 සිත් කල් නිමල් මෙසබ පස්මුවකැන් බෙලෙන් යුත්
ඒ නිල්වලා ගහ අරණ් රණබිම් සැපත්වී
සිත්කල් දහම් ලියසිපත් හොබවී එකල්හි
සව්පව් මතැත් රපුකැලන් නිතැතින් ඉවත්වී

94 සිත්කල්, චිත්තකාන්තාවූ; නන්බෙලෙන්යුත්, නොයෙක්බලයෙන් යුක්තවූ; නිමල්, නිර්මලවූ; මෙසබ, මේසභානමැති; පස්මුවකැන්, සිංහස මූහයා; ඒනිල්වලාගහ, ඒ නීලවලාහක ගර්ජනානමැති; රණබිම්අරණ්, යුද්ධභූමිඅරණ්‍යට; සැපත්වී, සම්ප්‍රාප්තව; සිත්කල්, සිත්අලවන්නාවූ; ද හම්, ධර්මනමැති; අසිපත්ලිය, ඛඞ්ගපත්‍රලතාව; හොබවී, හෙබවිය; එකල් හි, එවිට; සව්පව්, සියළුපාපනමැති; මත්ඇත්රුපුකැලන්, මත්තහස්ති ශත්‍රුසමූහයා; නිතැතින්, නිරුත්සහයෙන්; ඉවත්වී, පහවිය.

95 දහම් තෙදින් සිත් රැදිපව් සතන්ගේ
මුලින් සිදිගොස් නිතියෙන් පහන්වී
රුවන් කැළුම් එක්වපහන් කැළුම්නෙන්
සියල් තමස් රැස්ද නිතින් සබේමේ

95 සතුන්ගේ, සත්වයන්ගේ; සිත්රැඳි, සිත්හරඤ්ජිතවූ; පව්, පාපය
න්; දහම් තෙදින්, ධර්මතේජසකාරණකොටගෙණ; මුලින්සිඳිගොස්, මූ
ලෝච්ඡිනනවගොස්; නිතියෙන්, නිරන්තරයෙන්; උතුම්, ප්‍රධානවූ;
රුවන්කැළුම්එක්ව, රත්නකාන්තිසහාඑක්ව; පහන්කැළුම්ගෙනන්, ප්‍රදීප
කාන්තියෙන්; මේසබේ, මේසභාවෙහි; සියල්නමස්රැස්ද, සියළුඅන්ධකාර
සමූහයද; නිතින්, නිරන්තරයෙන් සිඳීගියේය.

96 දිව්කැන්වැටුප් රිවිනැතත් සඳකැන් අඳිස්වන්
ඒ පින් සබේදිලි තමස් බිඳිමින් දවස්රැ
උස්කම් සිතින් හලදසිත්දිරියෙන් පවත්නා
සව්සත් විසූ එහි නිතින් වඩමින් සිතේලොල්

96 රිවිනැතත්, සූර්‍ය්‍යනැත්තේවිනමුත්; සඳකැන්, චන්ද්‍රකාන්තිය; අ
ඳිස්වත්, අදෘශ්‍යමානවූවත්; වැටුප්, පහන්හී; දිව්කැන්, දිප්තිමත්වූ කා
න්තිය; දවස්රැ, දවල්හිදරැද; ඒපින් සබේ, ඒපුණ්‍යසභාවෙහි; තමස්,
අන්ධකාරය; බිඳිමින්, භගනකරමින්; දිලි, දිප්තිමත්විය; උස්කම්, පඤ්ච
කාමය; සිතින්, චිත්තයෙන්; හලද, හළේද; පවත්නා, ප්‍රවෘත්තිනවන්
නවූ; සිත්දිරියෙන්, සිත්හිධෛර්‍ය්‍යයෙන්; නිතින්, නිරන්තරයෙන්; සව්
සත්, සකලසත්වයෝ; සිතේ, චිත්තයෙහි; ලොල්වඩමින්, ලෝභවර්ධනය
කරමින්; එහිවිසූ, එහිවාසයකළානුයි.

97 සොඳුරු ලකර රතෙනන් සිත්කල්පසන් සව්සිරින් යුත්
සුරිඳුපුර විමල් මේ පින් සබාදූය් අඳූස් ගත්
නානාවිගෙණ වෙසෙත් ඒ සක්පුරේදින් බියෙන්දෙව්
මෙහිනිතර විසූසව්සත් දනාන් වී බියෙන්මුත්

97 ලකරනෙන්, අලඞ්කාරයෙන්; සිත්කල්, චිත්තකාන්තවූ; පසන්,
ප්‍රසන්නවූ; සව්සිරින්යුත්, සකලෛශ්වර්‍ය්‍යයෙන්; යුක්තවූ, සුරිඳුපුර; ශක්‍ර
පුරය, සොඳුරු, සුන්දරද; විමල්, නිර්මලවූ; මේපින්සබාදූය්, මේපුණ්‍යස
භාවද්‍යෝහොයි; අඳූස්ගත්, අදහස්ගත් ජනයෙනි; ඒසක්පුරේ, ඒශක්‍රපුර
යෙහි; දෙව්, දෙව්යෝ; දිත්බියෙන්, අසුරභීතියෙන්; නාන්අවිගෙණ,
නොයෙක්ආයුධග්‍රහණයකොට; වෙසෙත්, වාසයකෙරෙත්; මෙහි, මේ
පුණ්‍යසභාවෙහි; සව්සත්දනන්, සියළුසජ්ජනයෝ; බියෙන්මුත්ව්, භීති
යෙන්මුක්තව; නිතර, නිරන්තරයෙන්, විසූ; වාසයකළෝ.

98 කුමුදුසද කැළුම්වන් මේ සබේ දූ කැළුම්තිත්
එකාගනව සැදීගොස් සව්ලොවේ ශ්ස්වතුන්ගේ
නොවෙන සවකෙලෙස් පව් කොයිගියේදූයි තෙනෙත්හී
කිරිඳුවිදු කොතැන් දූය් සක්සූරන් කොයි ගියේදූය්

98 කුමුදු, කෞමුදය; සඳකැළුම්, චන්ද්‍රකාන්තිය; වන්, වැනිවූ; මේඝ රෙබ්, මේඝභාවෙහි; ද, ධාතූන්ගේ; කිත්කැළුම්, කීර්තිලක්ෂණකාන්තිය; එකඟනව, ඒකඝනව; සැදිගොස්, සර්ජිතවීගොස්; සව්ලොවෙ, සකලලෝකයෙහි; දේවතුන්ගේ, ශ්වේතවස්තූන්ගේ; නොවෙහසවී, වෙහසක්නොවීය; කෙලෙස්පව්, කෛලාසපර්වතය; කොස්කිසේදය්, කොතැන්හිකිසේදය්; තෙනෙත්, ඊශ්වරයාණිය; කිරිඳු, ක්ෂීරසාගරය; කොතැන්දය්, කොතනකදයි; උවිඳු, උපේන්ද්‍රයාණිය; සුරන්, දේවතාවන්; කොස්හිසේදය්, කොතැන්හිකිසේදැයිකිය; සක්, ශක්‍රයාණිය.

99 අනාගිසැපසිරින් යුත් මේසබෙ බෝ සතුන්මෙත්
බුදුබවට වැඩුම්කල්හි ගොසින් බෝමුලස්නේ
යුදටෙන වසවත් මන්බුන් කෙරේවා පතාලා
පැහැදසිතු ගහිම් සක් දෙව්පිදු සක් සැපත්යය්

99 අනගි, අනර්ඝවූ; සැපසිරින්යුත්, සැපඓශ්වර්යශ්‍රීයෙන්යුක්තවූ; මේසබේ, මේඝභාව; මෙත්බෝසතුන්, මෛත්‍රීබෝසතානන්වහන්සේ; බුදුබවට, බුද්ධභාවයපිණිස; ගොසින්, ගමනයකොට; බෝමුල්, බෝධිද්‍රැමමූලයෙහි; අස්නේ, වජ්‍රාසනයෙහි; වැඩඋන්කල්හී, වැඩඋන්කාලයෙහි; යුදවඑන, යුධයටඑනානාවූ; වසවත්, වසවර්තිමාරයාගේ; මන්, මානය; බුන්කෙරේව, භග්නකෙරේවායයි; පතාලා, ප්‍රාර්ථනාකොට; සක්දෙව්, ශක්‍රදේවේන්ද්‍රයාවිසින්; සිතුපැහැද, චිත්තප්‍රසන්නව; පිදූ, පූජාකළාවූ; සක්සැපත්යයි, ශක්‍රසම්පත්තියයි; හහිම්, සිතමි.

I00 යුත් නිල්වලා ගහදර වසවිද සෙල්වි
නාවත් බිජී සුමනදෙව් ගිරමිද පවිනත්
රස්නාදිලි නුදල පව්රදවිද සිත්කල්
රුත්වී සරම් මුදලිඳු වද මේ සබෙ දුල්

100 වලායුත්, උරභාසනයෙන් යුක්තවූ; නිල්, විශ්ණුහුද; සෙල්වී, කෛලාසයෙහි; වසවිද, වාසයකරන්නාවූ; ගහදර, ඊශ්වරයාද; මීද, මූෂිකවාහනහෙහි; නාවත්, ගණේශ්වරයාද; අනන්පව්, නොයෙක්පර්වතයන් ගෙන්යුක්තවූ; ගිර, සමන්තකූලපර්වතයෙහි; බිජී, භ්‍රාජමානවූ; සුමනදෙව්, සුමනදිව්‍යරාජයාද; උදයපව්රදවිද, උදයපර්වතමස්තකයෙහි; දිලි, දිප්තිමත්වූ; රස්නා, සූර්‍යදිව්‍යරාජයාද යනමොවුන් විසින්; රුක්වී, ආරක්ෂාකරණලද; සරම්මුදලිඳුවද, සරම්නම් මුදලිමන්ත්‍රිශ්වරතෙම; සිත්කල්, මනෝඥවූ; මේසබෙ, මේඝභාවෙහි; දුල්, දීප්තිමත්වූයේය,

101 පතුල-ලකුරණෙන් සියුත් සතොස්නා
මිහිර්බසින් සරහා ගෙතු ගතින් යුත්
ගහරුවන නාමේ කිවින් සිතණ්හි
නිතර රැදි මතු ලක්දිවේ බෙජේවා

101 සිඳුන්සතොස්නා, තරුණයන් සන්තොෂකරන්නාවූ; ලෙලකර ණෙන්, මාදිඅලඞ්කාරයෙන්; පතු, ප්‍රාප්තවූ; මිහිරිබසින්, මධුරවචන යෙන්; ගලප, ගළපාකොට; ගෙතූ, ග්‍රන්ථනයකළාවූ; ගතින්යුත්, ග්‍රන් ථයන්ගෙන්යුක්තවූ; මේගනරුවනන, මේඝභාරෝහණව ... නාව; කිවි න්සිතණ්ඩි, කවින්ගේචිත්තයන්හි; නිතර, නිරන්තරයෙන්; රැඳී, රජි තව; මතු, අනාගතකාලයෙහි; ලක්දිවේ, ලඞ්කාද්වීපයෙහි; බෙජේවා, භ්‍රාජිතවේවා.

102

කිවිසිත් තොස්වඩනා නිතින් සුරබිදෙන් වන්කපරුකෙවිසින්මිණෙව
පුන්සේ කැන්සොඳ දෙව් ගනෙව් යසහරන් දික්සල් ගානින්බැඳු
සව්වන්සාත්රැඳි වත්සරේ නිතිඉලන්ගක්සොන්නමින් ලෙව්පසන්
පින්වන්සත්ගුණයෙන්දිමුත්අගමැතින්සෙවිනෙන්ලැබුසව්සැපත්

102 සුරබිදෙන්වන්, සුරභිධේනුවක්මෙන්ද; කපරුක්එව්, කල්පවෘක්ෂ යක්මෙන්ද; සින්මිණෙව්, චින්තාමාණික්‍යයක්මෙන්ද; නිතින්, නිරන්තර යෙන්; කවි, කවින්ගේ; සිත්තොස්වඩනා, චිත්තසන්තෝෂවර්ධනයකර න්නාවූ; පුන්සේකැන්, පූර්ණචන්ද්‍රකාන්තියද; සොඳ, සුන්දරවූ; දෙව්ගනෙ ව්, ආකාශගඞ්ගාවමැනිවූ; යසහරන්, යසස්නමැතිමුක්තාහාරයන්; දික්ස ල්, දිශානමැතිකාන්තාවන්ගේ; ගලන්හිබඳු, කණ්ඨයන්හිබහාළාවූ; වත්සරේ, මුඛපද්මයෙහි; නිති, නිරන්තරයෙන්; සිටිවත්කත්, සරස්වති ය; රැඳි, රජිතවූ; ඉලන්ගක්සොන් නමින්, ඉලඞ්ගක්කෝන්සන නාම යෙන්; ලෙව්පසන්, ලෝකයාට ප්‍රසන්නවූ; සත්ගුණයෙන්, ශොභනගුණ යෙන්; දිමුත්, දීප්තිමත්වූ; පින්වත්, පුණ්‍යවන්තවූ; අගමැතින්, අග්‍රම න්ත්‍රීන්; සෙවිනෙන්, සේවනයකිරීමෙන්; සව්සැපත්ලැබූ, සකලසම්පත් ලැබූවාවූ.

103 සව්කවි නිවෙස් දනපදේ ගිරිපාදනම් යුත්
දූගොය් කුලේ සමරසේකරනම් දිසානා
නම් ලෙව්පසන් කිවිතුමා ගුණයෙන් නැනින්යුත්
මේ ගත්සියේ හෙළුබසින් ගළපා මෙසේයා

103 සව්කවිනිවෙස්, සකලකවීන්ටනිවාසස්ථානවූ; ගිරිපාදනම්යුත්ද නපදේ, එනම් නාමයෙන් යුක්තජනපදයෙහි; ගොය්කුලේද, ගොයිවංශ යෙහි උපන්නාවූ; සමරසේකරනම්, සමරශේඛරනාමයෙන්ද; දිසානාන ම්, දිශානායකනාමයෙන්ද; ලෙව්පසන්, ලෝකයෙහිප්‍රශංසනීයවූ; ගුණ යෙන්නැනින්යුත්, ගුණයෙන්හා ඥානයෙන්යුක්තවූ; කිවිතුමා, කවිව රතෙම; මේගත්සියේ, මේග්‍රන්ථශතය; හෙළුබසින්, සිංහලභාෂාවෙන්; මෙසේගළපා, මෙපරිද්දෙන්ගොතා; නී, කථනයකෙළේයි.

නිෂ්ඨාවී.



